(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 7.]

# පාර්ලිමේන්තුවේ

# න්‍යාය පුස්තකය

**2017 අගෝස්තු මස 22 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2017 අගෝස්තු මස 11 වැනි සිකුරාදා**

---

**2017 අගෝස්තු මස 22 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

101/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ වෛද්‍යවරුන්ගේ නමින් ලියාපදිංචි කර ඇති වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් පූර්ණකාලීන හා අර්ධකාලීන වශයෙන් ලියාපදිංචිය ලබා ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෛද්‍යවරුන් සතු පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිබඳ අවසන් වරට සංගණනයක් සිදු කළ දිනය කවරේද;

(ii) නැවත සංගණනයක් සිදු කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලියාපදිංචි සහතිකයක් නොමැතිව පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යෑමට එරෙහිව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(ii) ලියාපදිංචි නොකළ වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා පසුගිය වසර දෙකක කාලය තුළ ගත් නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(iii) ලියාපදිංචි නොකළ වෛද්‍ය මධ්‍යස්ථානයන් හිමි වෛද්‍යවරුන්ගේ නම් සහ ලබා දුන් දඬුවම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1175/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ඉදි කිරීම සඳහා වැයවූ සමස්ත පිරිවැය කොපමණද;

(ii) එකී වරායේ අයිතියෙන් යම් ප්‍රතිශතයක් පෞද්ගලික අංශයට විකිණීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ විකිණීමට බලාපොරොත්තු වන ප්‍රතිශතය කොපමණද;

(iv) එසේ විකිණීමෙන් අපේක්ෂා කරන අවම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1198/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුලතිව් දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1413/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 අයවැය යෝජනා අංක 177ට අනුව, මැණික් හා ස්වර්ණාභරණ පුහුණු ආයතනයෙහි පාඨමාලා හදාරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රදානය කළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව, ඒවායේ වටිනාකම සහ ශිෂ්‍යත්වලාභීන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1977 සිට මේ දක්වා මැණික් සහ ස්වර්ණාභරණ අපනයන මඟින් ඉපයූ විදේශ විනිමය ප්‍රමාණය, එක් එක් වර්ෂයේදී වර්ධනය වූ අයුරු දැක්වෙන දත්ත සටහනක් ඉදිරිපත් කරන්නේද;

(ii) වර්ෂ 2015න් පසු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි ප්‍රවර්ධනය සඳහා රජය අලුතින් හඳුන්වාදුන් ක්‍රමෝපායන් සහ වැඩසටහන් කවරේද;

(iii) වර්ෂ 2000 සිට මේ දක්වා චීනයට මැණික් අපනයනය සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රවණතා එක් එක් වර්ෂය අනුව ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1580/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, කොටුවේ පිහිටි ලංකා බැංකුවේ, 5 වැනි නගර ශාඛාව 1975.05.15 දින ආරම්භ කළ බවත්;

(ii) මේ වනවිට ගනුදෙනුකරුවන් 60,000කට අධික පිරිසක් එහි ගිණුම් ආරම්භ කර ඇති බවත්;

(iii) වර්තමාන කළමනාකාරිත්වයේ ඇති දුර්වල නිද්‍රාශීලී පාලනය හේතුවෙන් මෙම බැංකු ශාඛාව යම් ප්‍රමාණයකට පහතට වැටී ඇති බවත්;

(iv) ඒ හේතුවෙන් මෙම ශාඛාව, කොළඹ නගර ශාඛාවට අනුයුක්ත කිරීමට සූදානම් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දක්ෂ ක්‍රියාශීලී කළමනාකාරිත්වයක් යටතේ මෙම ශාඛාව මෙම ස්ථානයේම පවත්වාගෙන යෑමෙන් ගිණුම්හිමියන් 60,000කට පහසුකම් සැලසෙන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මෙම බැංකු ශාඛාව මෙම ස්ථානයේම පවත්වාගෙන යාමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1585/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) Commonwealth Game නමැති ගිණුමක් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ කවුරුන් විසින්ද;

(iii) එය ආරම්භ කළ දිනය කවරේද;

(iv) එම ගිණුමට රජයේ මුදල් හා පරිත්‍යාග කොපමණ බැර වී තිබේද;

(v) මේ වනවිට එම ගිණුමේ ඉතිරිව ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1594/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් මැටි හා වැලි කැනීම් සම්බන්ධයෙන් ලබාදී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම බලපත්‍ර නිකුත් කිරීමෙන් කාර්යාංශය ලැබූ ආදායම කොපමණද;

(iv) එසේ සිදුවන පාරිසරික හානිය වැළැක්වීමට කාර්යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1607/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,—විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලිය උත්පාදනය කිරීමේදී ද්‍රව තත්ත්වයට පත්කළ ස්වභාවික වායු (LNG) භාවිතා කිරීම සඳහා රජය විසින් තීරණයක් ගෙන තිබේද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදිත ස්වභාවික වායු වාණිජමය භාවිතයට ගැනීමට තවමත් හැකියාවක් නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, විදුලි උත්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන ද්‍රව තත්ත්වයට පත් කළ ස්වභාවික වායු ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සහ ගබඩා කිරීම පිළිබඳව රජයට ඇති වැඩපිළිවෙළ කවරේද;

(iv) එසේ නොමැති නම්, ද්‍රව ස්වභාවික වායු හඳුන්වාදෙන බව පවසමින් රජය විසින් සිදු කරනු ලබන්නේ ඩීසල් මඟින් විදුලිය නිෂ්පාදනය කරනු ලබන බලාගාර ඉදිකිරීමේ ක්‍රියාදාමයක්ද;

(v) එවැනි අනතුරුදායක තත්ත්වයක් පවතින්නේ නම්, රජය පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර නොගන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

9.

1613/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් විශාල ව්‍යාපෘති සඳහා ලබාදීමේ ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වලව කලාපයේ, චන්ද්‍රිකා වැව කොට්ඨාසයේ, ඩෝල් ලංකා සමාගම හා විටා ඕගනී සමාගම වෙත කෙසෙල් වගා කිරීම සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ඉඩම් නිසි ක්‍රමවේදයක් අනුව ලබා දී නොමැති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1629/'17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "සූර්ය බල සංග්‍රාමය" ව්‍යාපෘතිය යටතේ මේ දක්වා සූර්ය විදුලිබල සබඳතා ලබාගෙන ඇති පාරිභෝගික සංඛ්‍යාව කොපමණද;

(ii) "සූර්ය බල සංග්‍රාමය" වැඩපිළිවෙළ යටතේ පාරිභෝගිකයෙකු විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දෙන විදුලි ඒකකයක් සඳහා ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) මුල් ව්‍යාපෘති යටතේ, ඉදිරි වසර 5ක කාලය තුළ ජාතික පද්ධතියට ලබා ගැනීමට අපේක්ෂා කරන විදුලිබල ධාරිතාවය කොපමණද;

(iv) සූර්ය විදුලි බලය, ජාතික පද්ධතියට එක් කිරීම පිළිබඳව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් දක්වනු ලබන මන්දගාමී ප්‍රතිපත්තියට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1634/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, චුන්නාක්කම් ප්‍රදේශයේ මෙගාවොට් 10 බැඟින් වූ සුළං බලාගාර දෙකක් ඉදිකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ටෙන්ඩර ලබාගත් සමාගම් දෙක කවරේද;

(iv) එම සමාගම් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම එක් එක් ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1640/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(ii) එම ආයතන කුලී පදනමින් ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යන්නේ නම්, එම ගොඩනැගිලිවල නම් සහ එම ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් අමාත්‍යාංශය විසින් ගෙවනු ලබන වාර්ෂික කුලිය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අමාත්‍යාංශය විසින් ගොඩනැගිලි කුලියට ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1672/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙම වගා කන්නයේදී ලංකාවේ වී වගා කළ සමස්ත බිම් ප්‍රමාණය කොපමණද;

(ii) පවතින දැඩි නියඟය හේතුවෙන් වගා හානි වූ බිම් ප්‍රමාණය කොපමණද;

(iii) නියඟයෙන් රටට අහිමි වේ යැයි තක්සේරු කර ඇති වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වගා හානි වූ ගොවීන් වෙනුවෙන් රජය ලබාදීමට බලාපොරොත්තු වන සහන කවරේද;

(ii) ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1676/'17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව සහ ඒවායේ නම්, එක් එක් මාධ්‍යය අනුව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව අධ්‍යාපන විද්‍යාපීඨයේ පවත්වනු ලබන පාඨමාලාවල නම් කවරේද;

(ii) එක් එක් පාඨමාලාව තුළ පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කවරේද;

(iii) මඩකලපුව අධ්‍යාපන විද්‍යාපීඨය තුළ පැවැත්විය හැකි අනිකුත් දෙමළ මාධ්‍ය පාඨමාලා එම විද්‍යාපීඨය තුළ නොපැවැත්වීමට හේතුව කවරේද;

(iv) මඩකලපුව අධ්‍යාපන විද්‍යාපීඨයෙහි පැවැත්වීමට ශක්‍යතාවක් ඇති අනිකුත් දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට පියවර ගන්නේද;

(v) එවැනි පාඨමාලා ආරම්භ කිරීම සඳහා සුදුසු දේශකවරුන් නොමැත්තේද;

(vi) එසේ නම්, එවැනි කාණ්ඩවලට අවශ්‍ය දේශකවරුන් පත්කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1682/'17

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඔක්කම්පිටිය, කඳුරුවැලැන ඩී. එම්. ජයතිස්ස මහතා 1983 වර්ෂයේදී පොලිස් සේවයට බැඳී පො. කො. 5439 දරන නිල අංකය යටතේ සේවය කළ බවත්;

(ii) ඔහු පොලිස් විශේෂ කාර්යය බලකායේ වසර 09ක කාලයක් අම්පාර, මඩකලපුව ප්‍රදේශවල සේවය කර ඇති බවත්;

(iii) 1994 වර්ෂයේදී අසත්‍ය චෝදනාවක් මත පොලිස් සේවයෙන් ඉවත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු, නැවත සේවයේ පිහිටුවන ලෙස කළ නියෝගය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අවස්ථා 03ක දී නැවත ඉදිරිපත් කරන ලද පෙත්සම් සලකා බලා ඔහු වෙත අසාධාරණයක් සිදුවී ඇති බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තීරණය කිරීමෙන් පසුව හිඟ වැටුප් සහිතව රැකියාව ලබා දෙන ලෙස කළ නියෝගයද ක්‍රියාත්මක නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවත සේවයේ පිහිටුවන ලෙස කාරක සභාවෙන් අවස්ථා 03කදී කරන ලද ඉල්ලීම් පැහැර හැරීම ඔහුට කරන ලද බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

(ii) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නියෝගය ක්‍රියාත්මක කරමින්, ජයතිස්ස මහතා නැවත සේවයේ පිහිටුවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 117 — වැඩසටහන 02,—† 2017 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භවන 2017 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වන මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලක් හෝ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා ලද ණය මුදලකින් හෝ රුපියල් 53,000,000,000 (රුපියල් බිලියන 53)කට නොවැඩි පරිපූරක මුදලක් පහත දක්වා ඇති උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතු ය.

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | - | 117 උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | | |
| වැඩසටහන | - | 2 සංවර්ධන වැඩසටහන | | |
| | | | | <u>රුපියල් මිලියන</u> |
| ව්‍යාපෘතිය | - | 3 **අධිවේගී මාර්ග සංවර්ධනය** | | 31,200.00 |
| | | විදේශීය අරමුදල් (මූල්‍යකරණය 12) | 30,000.00 | |
| | | දේශීය අරමුදල් (මූල්‍යකරණය 17) | 1,200.00 | |
| | | (උපලේඛන අංක 01) | | |
| | - | 4 **මහාමාර්ග සංවර්ධනය** | | 15,800.00 |
| | | (විදේශාධාර හා සබැඳි දේශීය අරමුදල් හා විදේශීය ණය) | | |
| | | (උපලේඛන අංක 02) | | |
| | | විදේශීය අරමුදල් (මූල්‍යකරණය 12) | 14,500.00 | |
| | | දේශීය අරමුදල් (මූල්‍යකරණය 17) | 1,300.00 | |
| | | (උපලේඛන අංක 02) | | |
| | - | 6 **පාලම් සහ ගුවන් පාලම් ඉදි කිරීම** | | 6,000.00 |
| | | (විදේශීය ණය) (මූල්‍යකරණය 12) | | |
| | | (උපලේඛන අංක 03) | | |
| | | මුළු වියදම | | **<u>53,000.00</u>** |

(රුපියල් බිලියන පනස් තුනක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2017 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2017 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*2.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 31 දිනැති අංක 2021/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝගය,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 මැයි 05 දිනැති 2017/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

දේශීය ආදායම් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 21 දිනැති 2007/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.08.08 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උදර්පන පනත යටතේ නියමය (අංක 1),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජුනි 07 දිනැති අංක 2022/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උදර්පන පනත යටතේ නියමය (අංක 2),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුක්රේනය අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජුනි 02 දිනැති අංක 2021/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*14.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.26 දින සලකා බලන ලදී.)

*15.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.03.07 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.24 දින සලකා බලන ලදී.)

*16.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.05.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.26 දින සලකා බලන ලදී.)

*17.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2011),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.12.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*18.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*19.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*20.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*21.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*22.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*23.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.07.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*24.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.08.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*25.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*26.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

29.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

## 2017 අගෝස්තු මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම රෝහලේ සායන ගොඩනැගිල්ල සාදා නිම කර රෝහලට භාර දුන් දිනය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල සඳහා වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත ගොඩනැගිල්ල ඉදි කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) අදාළ කොන්ත්‍රාත්කරුට සම්පූර්ණ මුදල ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවූ මුදල කොපමණද;

(iv) එම කොන්ත්‍රාත්කරුගේ මුදල් රඳවා ගෙන තිබේද;

(v) එසේ නම්, රඳවාගෙන ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ගොඩනැගිල්ලෙහි බිත්ති පුපුරා ගොස් ඇති බවත්;

(ii) මේ නිසා රෝගීන්ගේ හා රෝහල් කාර්ය මණ්ඩලයේ ජීවිත වලට තර්ජනයක් ඇති බවත්;

(iii) මේ වනතෙක් එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම ගොඩනැගිල්ල පිළිසකර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පිළිසකර කිරීම් කටයුතු සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1176/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1199/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1414/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 199 ට අනුව, විදේශ ආයෝජනයන් සඳහා වන ඉල්ලුම්පත් සම්පූර්ණ කර දින 50 ක් තුළ වැඩ ඇරඹීම සහතික කරන වැඩපිළිවෙළක් හඳුන්වා දුන් බැවින්, 2016 වර්ෂයේදී එසේ දින 50 ක් තුළ වැඩ ආරම්භ කළ විදේශ ආයෝජන කවරේද;

(ii) උක්ත නැවුම් ප්‍රවේශය හේතුවෙන් 2016 වර්ෂය තුළදී රට තුළ ව්‍යාපාර ආරම්භ කළ විදේශ සමාගම් විසින් ශ්‍රී ලංකාවට රැගෙන ආ විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) විදේශීය ආයෝජකයෙකුට දින 50 ක් තුළ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීමේ ක්‍රියාවලිය හඳුන්වාදීමේදී, සාපේක්ෂව ඇතිකළ වෙනස්කම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1595/’17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනය මඟින් සේවා සපයනු ලබන ජන සංඛ්‍යාව, භූමි ප්‍රමාණය සහ ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනතාවට වැඩි පහසුකම් සපයා දීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කය තුළ අළුතින් ස්ථාපිත කිරීමට යෝජිත පළාත් පාලන ආයතන කවරේද;

(v) එසේ යෝජනා වී ඇති පළාත් පාලන ආයතන කඩිනමින් පිහිටුවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1614/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම්වල වැලි කැනීම් කටයුතු සඳහා අවසර ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

(ii) වලව කලාපය තුළ වැලි කැනීම් බලපත්‍රලාභීන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම කලාපය තුළ අනවසර වැලි කැනීම් විශාල ප්‍රමාණයක් සිදුවන බව පිළිගන්නේද;

(iv) එම තත්ත්වය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1630/’17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම මේ වනවිට ලෝකයේ පවතින නිෂ්පාදන වියදම අඩුම පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රය බව පිළිගන්නේද;

(ii) එසේ නම්, සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(iii) 2016.09.06 දින රජය විසින් දියත් කරන ලද "සූර්ය බල සංග්‍රාමය" නමැති වැඩසටහන මගින් මේ වනවිට ජාතික විදුලි පද්ධතියට එකතු කර ඇති විදුලිබල ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1635/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (Lanka Coal Company (Pvt.) Ltd.) පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එකී සමාගමේ ගිණුම් වාර්ෂිකව විගණනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර ආයතනයක් විසින්ද;

(iv) ගිණුම් විගණනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;

(v) එම සමාගම විසින් ගිණුම්කරණය පිළිබඳ නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යන බව සහතික කළ හැකිද;

(vi) එකී සමාගම ගිණුම්කරණය පිළිබඳ නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත්නම්, ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1641/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මාස කිහිපයේ සිට රටේ පවතින දැඩි නියඟය හේතුවෙන් ගොවීන් දැඩි පීඩාවට ලක් වූ බව පිළිගන්නේද;

(ii) එම නියඟය නිසා දැඩි හානියට පත් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ගොවිජන සේවා කලාප වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ පීඩාවට පත් වූ ගොවීන් වෙනුවෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් යම් වන්දි ගෙවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) නියඟය නිසා පීඩාවට පත් වූ ගොවීන් සඳහා වන්දි ලබාදීම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1695/'17

ගරු මොහොමඩ් නවවි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය සභාව නොරොච්චෝලෙයි ගම්මානය තුළ ළමා උද්‍යානයක් පිහිටුවීමට අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එබඳු ළමා උද්‍යානයක් පිහිටුවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාර්යය සඳහා කොපමණ මුදලක් ලැබී තිබේද;

(ii) එම මුදල් ලැබී ඇත්තේ කා වෙතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1712/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ මේ දක්වා කින්නියා රෝහලට ඇතුළත් කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කවරේද;

(ii) ප්‍රතිකාර ලබමින් සිටියදී ඒ අතරින් කී දෙනෙකු මියගියේද;

(iii) ඩෙංගු වසංගතය හේතුවෙන් කින්නියා රෝහලේ වෛද්‍යවරුන්, කාර්යමණ්ඩලය, ඇඳන් සහ ඉඩකඩ පිළිබඳ බරපතල හිඟයක් ඇතිවී තිබේද;

(iv) මෙම තත්ත්වය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) කින්නියා රෝහලේ පවතින වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් රෝගීන් ත්‍රිකුණාමලය රෝහලට මාරුකිරීම සිදුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1732/’17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත් තුළ පිහිටි එක් එක් අධ්‍යාපන කලාපයට අයත් මුස්ලිම් පාසල් සංඛ්‍යාව කවරේද;

(ii) ඉස්ලාම්, ඉස්ලාම් අධ්‍යයනය සහ අරාබි ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ (ඉස්ලාම්) නම් කවරේද;

(iii) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) නොමැති අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(iv) මෙම කලාපවල ඉහත කී විෂයයන් ඉගැන්වීම අධීක්ෂණය කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති අධීක්ෂකවරුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සඳහා පුරප්පාඩු දෙකක් පමණක් ගැසට් නිවේදනය තුළ පළ කරන ලද බවත්;

(ii) විෂයමාලාව තුළ ආගමික අධ්‍යාපනය අනිවාර්ය බවත්;

(iii) ඉස්ලාම් ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය නොකිරීම, මුස්ලිම් ශිෂ්‍යයන්ගේ ආගමික අධ්‍යාපනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයෙහි (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සේවක ගණන වැඩි කිරීමට පියවර ගනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, වැඩබලන පදනම මත සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) පත් කිරීමට පියවර ගනු ලබන්නේද;

(iii) එසේ නම්, එය සිදු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1775/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.03.31 දිනට ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2017.03.31 දිනට රාජකාරියේ නියුතු ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව, එක් එක් පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2017.03.31 දිනට පුරප්පාඩු වී ඇති ග්‍රාම නිලධාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ග්‍රාම නිලධාරීන් බඳවාගැනීමට තරඟ විභාගයක් පවත්වා තිබේද;

(iv) එසේ නම්, විභාගය පැවැත්වූ වර්ෂය සහ ඒ සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) විභාගයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබේද;

(vi) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(vii) ග්‍රාම නිලධාරි තනතුරු සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(viii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1200/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුද්ධමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1415/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 199ට අනුව, විදේශීය සමාගම් ලැයිස්තුගත කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ලාභාංශ යනාදිය ආදායම් බද්දෙන් නිදහස් කළ බැවින්, 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල විදේශ ආයෝජන ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 2009 යුදගැටුම් අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි ඇති වූ උපනතීන් පිළිබඳ (සම්මත දර්ශකයන්ට අනුව) වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) 2015 සහ 2016 වර්ෂවල විදේශිකයන් ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙන් ඉවත් කරගත් ආයෝජන ප්‍රමාණයන් කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි පුනර්ජීවනය සඳහා යෝජිත වෙනස්කම් සහ රාජ්‍ය මූල්‍ය සහ බදු සානුබලයන් කවරේද;

(v) 2016 අයවැයෙන් යෝජිත ප්‍රාග්ධන ලාභ බද්ද අනාගතයේදී කොටස් හුවමාරුවටද හඳුන්වාදීමේ අදහසක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 අගෝස්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

115/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව කලපු මෝය ආශ්‍රිතව පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කඩොලාන භූමි ප්‍රදේශයෙන් අක්කර අටක ප්‍රදේශයක නිවාස ව්‍යාපෘතියක් ඇතුළු සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇති බවත්;

(ii) මෙම ව්‍යාපෘතියට පරිසරවේදීන් විරෝධය පළකර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සැලසුමට අනුව උක්ත භූමි භාගයේ යෝජිත ඉදිකිරීම් කවරේද;

(ii) ඉහත කඩොලාන බිමෙහි ඉදිකිරීම් සිදු කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඉදිකිරීම් කටයුතු අරඹන දිනය කවරේද;

(iv) ඉදිකිරීම් කටයුතු සඳහා අවසර ලබාදීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් කරන්නේද;

(v) නොඑසේ නම්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කරන නීත්‍යානුකූල ක්‍රමවේදය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1173/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන සතු ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචිකරුවන් විසින් රජයේ ඉඩම් ප්‍රදාන/ බලපත්‍ර මත ලබා ගැනීම සඳහා අයදුම් කර තිබේද;

(iii) එසේ නම්, එම අයදුම්පත් ප්‍රමාණය කොපමණද;

(iv) එම අයදුම්කරුවන්ට මේ දක්වා ප්‍රදාන/බලපත්‍ර මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1177/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ගුවන් ගමන් පිළිබඳ රජයේ නිශ්චිත ප්‍රතිපත්තියක් තිබේද;

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා නොමිලේ භාවිතා කිරීමට හිමිකම් ඇති රජයේ තනතුරු දරන්නන් කවුරුන්ද;

(iii) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා නොමිලේ භාවිතා කිරීමට හිමිකම් ඇති රජයේ ආයතන කවරේද;

(iv) රජයේ මුදලින් දේශීය ගුවන් ගමන් යා හැකි තනතුරු දරන්නන් කවුරුන්ද;

(v) 2015.01.09 දින සිට 2016.10.31 දින දක්වා කාලය තුළදී රජයේ මුදලින්, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මුදලින්, රාජ්‍ය සමාගම්වල මුදලින් හෝ දේශීය ගුවන් ගමන් යෙදුණු රජයේ අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ නිලධාරීන්ගේ නම්, ඔවුන් දේශීය ගුවන් ගමන්වල යෙදුණු අවස්ථා, එසේ ගුවනින් ගමන් කිරීමට හේතු සහ එම ගමන්වල පිරිවැය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1201/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1416/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 199 වැනි යෝජනාවට අනුව, විනිමය පාලන පනත අහෝසි කිරීමට යෝජනා කිරීමේ අරමුණු කවරේද;

(ii) උක්ත අරමුණු ඉටුකර ගැනීමට අදාළ වන අයුරින් හඳුන්වාදීමට අපේක්ෂිත විනිමය කළමනාකරණ පනතෙහි අඩංගුවන ප්‍රධාන වෙනස්කම් කවරේද;

(iii) විනිමය කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලාවෙහි ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමට අදහස් කරන්නේද;

(iv) සාර්ක් කලාපය ඇතුළු දකුණු ආසියාතික රටවල ගෙවුම් තුලාවෙහි ප්‍රාග්ධන ගිණුම විවෘත කර ඇති රටවල් කවරේද; එම රටවල්වල ඇති වූ විදේශ මූල්‍ය ප්‍රවාහ ප්‍රවනතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1539/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් යහපාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා බදුල්ල දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලැබූ ක්‍රීඩා පිටි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩා පිටිවල නම් කවරේද;

(iii) එම එක් එක් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අදාළ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා ඔවුනට අමාත්‍යාංශය විසින් ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1615/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැව් තෙල් ආශ්‍රිතව විදුලි බලය නිපදවීමේ බලාගාරයක් ඇති බවත්;

(ii) මෙම බලාගාරයෙන් දැඩි පාරිසරික හානියක් සිදුවන බවත්;

(iii) මෙම බලාගාරය සඳහා පාරිසරික බලපත්‍ර ලබාදීම නිසි පරිදි සිදු නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම බලාගාරය අයත් සමාගම කවරේද;

(ii) මෙම සමාගම සමඟ ගිවිසුම්ගත කාලසීමාව කවරේද;

(iii) මෙම පාරිසරික හානිය අවම කර ප්‍රදේශයේ ජන ජීවිතයට සහනයක් සැලසීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1632/'17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය (Demand Side Management) පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පිළිගන්නේද;

(ii) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය පිළිබඳව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන කවරේද;

(iii) එකී වැඩසටහන මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1636/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (Lanka Coal Company (Pvt.) Ltd.) පිහිටුවීමේ අරමුණ කවරේද;

(ii) එම සමාගමේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය කවුරුන්ද;

(iv) 2016 ජූලි මාසයට අදාළව, එම සමාගමේ සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සේවකයන් විසින් ලබාගෙන ඇති වැටුප් සහ සියලු දීමනා කවරේද;

(v) එකී සමාගම පිහිටුවීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු වී තිබේද;

(vi) ගල් අඟුරු මිලදී ගැනීම වැනි බරපතල ව්‍යාපාරික කටයුත්තක් සිදු කිරීමට එකී සමාගමට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1668/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ වන අලි ගම්වැදීම හේතුවෙන් මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මියගිය පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) පුත්තලම දිස්ත්‍රික්කයේ වන අලි තර්ජනයට මුහුණ පා සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iv) මෙම ගැටලුවට මුහුණ දීම හේතුවෙන් ජීවිත, නිවාස හා වගා හානිවූ පුද්ගලයන්ට අමාත්‍යාංශය හරහා සහන ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1683/'17

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1987 වර්ෂයේදී මඩකලපුව දිස්ත්‍රික්කයේ, මුනන්කුඩිච්චි ග්‍රාමසේවා වසමේ එරාවූර්, පුන්නකුඩා ධීවර ගම්මානයේ පදිංචිව සිටි ඩබ්ලිව්. හැරිසන් ප්‍රනාන්දු මහතා ඇතුළු ගම්වාසීන්ට කොටි ත්‍රස්තවාදීන් විසින් අමානුෂික ප්‍රහාරයක් එල්ලකර ජීවිත ගණනාවක් විනාශ කළ බවත්;

(ii) එම සිදුවීමෙන් ඒ මහතාගේ ව්‍යාපාරික ස්ථානය, යානවාහන සහ ඔහු සතු සියල්ල අහිමිවූ බවත්;

(iii) තැනැත්තන්, දේපල සහ කර්මාන්ත පුනරුත්ථාපන කිරීමේ අධිකාරිය මඟින් 1996.03.14 දිනැති ලිපියෙන් අදාළ කරුණ සනාථ කර ඇතත්, මෙතෙක් ඔහු ඇතුළු එම පවුලේ අයට සිදුවූ හානිය පිළිබඳව කවර හෝ සහනයක් සැලසී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය, වරුණගම නමැති ගම්මානයේ දැනට පදිංචිව සිටින හැරිසන් ප්‍රනාන්දු මහතාට සිදුවූ හානිය වෙනුවෙන් වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, වන්දි මුදල ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1689/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී මතුගම, වෝගන් වත්තේ, පහළ කොටසේ සිදුවූ නායයෑමෙන් පසුව පවුල් 14ක් දැඩි අවදානම් තත්ත්වයක් මත තවමත් එහි පදිංචිව සිටින බවත්;

(ii) එම ස්ථානයෙන් එම ජනතාවගේ වාසස්ථාන ඉවත් කළ යුතුයැයි 2014 ජුනි මාසයේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වතු කළමණාකාරිත්වයට උපදෙස් දී ඇති බවත්;

(iii) විකල්ප ස්ථාන වෙන්කිරීම පිළිබඳව වතු කළමනාකාරිත්වය හා මෙම ජනතාව අතර ඇති වී තිබෙන ගැටුම හේතුවෙන් විකල්ප ඉඩම් ලබාදීම ප්‍රමාද වී ඇති බවත්;

(iv) මේ හා සමානව නායයෑමේ අවදානමක් පවතින අගලවත්ත, ඩෙල්කිත් වත්තේ, ඉලුප්පුවත්ත කොටස තුළත් පවුල් 21ක් පසුගිය වර්ෂ 2 ක පමණ කාලයක සිට ජීවත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කළ පරිදි පීඩාවට පත්වී, ජීවිත අවදානමකට මුහුණදී සිටින ජනතාව සඳහා යම් නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1693/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයාගේ නම කුමක්ද;

(iv) ඉහත තනතුර දැරීමට ඔහු සපුරා ඇති අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1694/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුල්මුඩේ ලංකා ඛනිජ වැලි සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම සමාගමේ වර්තමාන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසරේදී මෙම සමාගම ලැබූ ලාභය කොපමණද;

(iv) එකී සමාගම යටතේ ක්‍රියාත්මක අංශ කවරේද;

(v) එක් එක් අංශයේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමාගමට අලුතින් බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් බඳවා ගැනීම සඳහා අනුගමනය කළ බඳවාගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1696/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, උලපනේ ප්‍රදේශයේ පිහිටි රෝහණ විජේවීර මහතා භාවිතා කළ ඉඩම හා නිවස මේ වනවිට රජය විසින් යම් කටයුත්තක් සඳහා යොදා ගන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම හා නිවස රජයේ කටයුත්තකට පවරා ගෙන ඇත්තේ ඔහුගේ පවුලට හෝ වෙනත් ආයතනයකට වන්දි මුදලක් ගෙවීමකින් පසුවද;

(iii) එසේ නම්, ගෙවූ වන්දි මුදල හා දිනය කවරේද;

(iv) නොඑසේ නම්, එම ඉඩම හා නිවස රජය විසින් පවරාගත් පදනම හා මේ වනවිට භුක්ති විඳින පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 අගෝස්තු මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

116/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බාහිර සිසුන් සඳහා ප්‍රථම උපාධි පාඨමාලා පවත්වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල කවරේද;

(ii) එම විශ්වවිද්‍යාල පවත්වන එවැනි පාඨමාලා එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට ලියාපදිංචි සිසුන් ප්‍රමාණය එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලවල බාහිර උපාධි හැදෑරීම සඳහා අවසන් වරට සිසුන් ලියාපදිංචි කළ දිනය එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සිසුන් ලියාපදිංචි කිරීම ක්‍රමවත් කාල ප්‍රාන්තරයක් අනුව සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) ප්‍රථම බාහිර උපාධිය සඳහා සිසුන් ලියාපදිංචිය සීමා කිරීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1202/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1418/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 අයවැය යෝජනා අංක 198 හි දැක්වෙන පරිදි 2015 සහ 2016 වර්ෂ තුළදී,

(i) තෙල් පිරිපහදුව;
(ii) පුනර්ජනනීය බලශක්තිය;
(iii) ඒකාබද්ධ මෝටර් රථ නිෂ්පාදනය;
(iv) කලාපය සඳහා වානේ පාලම් නිෂ්පාදනය;
(v) පොහොර, ට්‍රිපල් සුපර් ෆොස්පේට් නිෂ්පාදනය;
(vi) චන්ද්‍රිකා තාක්ෂණය;
(vii) ගුවන් යානා අළුත්වැඩියාව සහ එයට සහායක ක්‍රියාවන්;
(viii) ඒකාබද්ධ සීනි නිෂ්පාදනය;

යන ක්ෂේත්‍ර වෙනුවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ ආයෝජන කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දිනට ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්වල විදේශීය ආයෝජන ප්‍රමාණය කොපමණද;

(ii) 2017.01.01 දිනට රජයේ සුරකුම්පත්වල විදේශ ආයෝජන ප්‍රමාණය කොපමණද;

(iii) ෆිච් රේටිං සහ මෝචි ආයතන විසින් 2014, 2015, 2016 යන වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවට ලබා දුන් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1511/’17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂය තුළ වාර්තා වූ රිය අනතුරු සංඛ්‍යාව සහ රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2014 සහ 2015 ට සාපේක්ෂව, 2016 වර්ෂය තුළදී සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව සහ රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණ සංඛ්‍යාවකින් ඉහළ ගොස් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1540/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල මූලාශ්‍ර සිඳී යෑමෙන් උඩපේරුව, අරාවත්ත, මකුල් ඇල්ල සහ එගොඩගම ඇතුළු බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල පීඩාවකට ලක් වී ඇති බව දන්නේද;

(ii) එම ජනතාවට පානීය හා වෙනත් ජල පහසුකම් ලබාදීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1620/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය නගරය තුළ ව්‍යාපාරික ස්ථාන හිමි ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාරික ස්ථාන සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට බදු ගෙවීමට සිදුවී ඇති බව දන්නේද;

(ii) මේ සඳහා බදු අය කරනු ලබන්නේ අදාළ ඉඩම් කොටසටද; නොඑසේ නම්, ව්‍යාපාරිකයන් තම වියදමින් නිමකළ ගොඩනැගිලිවලටද යන්න සඳහන් කරන්නේද;

(iii) මෙම බදු අය කිරීමට අදාළව, බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා නිර්දේශ කර ඇති ලේඛන ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම ව්‍යාපාරික ස්ථානයක් වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී ලැබෙන මුදලින් 25%ක් අදාළ විහාරස්ථානය වෙත ගෙවිය යුතු බවට බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාගේ නියමයක් තිබේද;

(v) එසේ නම්, තම පෞද්ගලික මුදලින් නිමකළ විශාල ගොඩනැගිලි සමඟ තම ව්‍යාපාර ස්ථාන විකිණීමේදී ඔවුන්ට විශාල අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1637/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, පුනරීන් ප්‍රදේශයේ පුනර්ජනනීය බලශක්ති උද්‍යානය ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එම පුනර්ජනනීය බලශක්ති උද්‍යානයෙන් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත සූර්ය බලශක්ති ප්‍රමාණය කොපමණද;

(iii) එම බලශක්ති උද්‍යානය තුළ නිපදවීමට අපේක්ෂා කරන සුළං බලශක්ති ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1669/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය සහ කැළිකසල බැහැර කරන ස්ථාන කවරේද;

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් මෙම පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් පළාත් පාලන ආයතනයකට ලබා දී ඇති පහසුකම් හා මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1684/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී, නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නම්, අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1690/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, කොන්දේසි සහිතව නකල්ස් කඳු වැටිය සඳහා ලෝක උරුම තත්ත්වය ලැබුණු බවත්;

(ii) ඉහත කොන්දේසිවල ප්‍රධාන කොන්දේසිය ප්‍රකාරව, නකල්ස් කඳුවැටියට ඉතා ආසන්නව පිහිටි මිනිපේ, පන්විල, පාතදුම්බර, උඩදුම්බර, ලග්ගල, විල්ගමුව, රත්තොට, උකුවෙල හා මාතලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ට අයත් අක්කර 2000ක විශාලත්වයෙන් යුත් භූමි ප්‍රමාණයක් උක්ත කඳුවැටිය සමඟ ඒකාබද්ධ කර නොමැති බවත්;

(iii) එබැවින්, නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීම වළක්වා ගැනීම සඳහා ඉහත සඳහන් අක්කර 2000ක භූමි ප්‍රමාණය නකල්ස් කඳු වැටිය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1697/'17

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ "ගූගල් ලූන්" ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගූගල් සමාගම හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) මේ සඳහා ගූගල් සමාගම තෝරා ගැනීමට රජය තීරණය කළ පදනම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය ලබාදීමට එකඟ වූ හා ලබාදුන් පහසුකම් කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයට වැය වූ මුදල කොපමණද;

(v) ගූගල් සමාගම ගුවන්ගත කළ බැලූනය කඩා වැටීමට බලපෑ හේතුව කවරේද;

(vi) ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් නිකුත් කර තිබේද;

(vii) ගූගල් සමාගම මෙම ව්‍යාපෘතිය අතහැර ඇති බවට ප්‍රකාශ කර තිබේද;

(viii) එසේ නම්, අදාළ ගිවිසුම හා එකඟතා කඩවීම හේතුවෙන් ඇති වූ මූල්‍යමය හා අනිකුත් හානි කවරේද;

(ix) එම හානිවල වගකීම පැවරෙන්නේ කාහටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

118/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම් අවම මට්ටමක පවතින බවත්;

(ii) පශු වෛද්‍යවරුන්ගේ හිඟයක් ඇති බවත්;

(iii) සතුන් කිහිප දෙනෙකු මෙම තත්ත්වය තුළ මිය ගොස් ඇති බවත්;

(iv) තවත් සතුන් කිහිප දෙනෙකු රෝගාතුරව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 2013.01.01 සිට 2015.06.30 දක්වා කාලය තුළ දෙහිවල සත්වෝද්‍යානය තුළදී, මියගිය සතුන්ගේ වර්ගය, වයස හා මිය යෑමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දෙහිවල සත්වෝද්‍යානයට අනුයුක්තව සිටිය යුතු අවම පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට දෙහිවල සත්වෝද්‍යානයේ සේවය කරන පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1203/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1420/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 187 යෝජනාවෙන් හඳුන්වාදීමට යෝජනා කරන ලද ඩිජිටල් හැඳුනුම්පතෙහි දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම හැඳුනුම්පත නිකුත් කිරීමේ බලධාරියා කවුරුන්ද;

(iii) පුරවැසියන්ට හැඳුනුම්පත් ලබාදීම වෙනුවෙන් ඇස්තමේන්තු පිරිවැය කොපමණද;

(iv) එම පිරිවැය දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(v) 2017 වර්ෂය තුළදී ඩිජිටල් හැඳුනුම්පත් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අයවැයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1512/’17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි මුළු සේවා නියුක්තිය කොපමණද;

(ii) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය ඉහළ ගොස් ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 සැප්තැම්බර් මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

119/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013.06.30 දින සිට 2015.06.30 දින දක්වා කාලය තුළ විනය ක්‍රියාමාර්ග ලෙස ශිෂ්‍යභාවය අහෝසි කළ, පන්ති තහනම් කළ හා අධිකරණ ක්‍රියාමාර්ග ගත් විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව විශ්වවිද්‍යාලය අනුව;

(ii) එම එක් එක් ශිෂ්‍යයාගේ නම, ලිපිනය හා දුරකථන අංකය විශ්වවිද්‍යාලය අනුව;

(iii) උක්ත සිසුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හේතුව එක් එක් ශිෂ්‍යයා අනුව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍ය අරගල සඳහා විසඳුම විනය ක්‍රියාමාර්ග නොවන බවත්;

(ii) ශිෂ්‍ය ඉල්ලීම් සම්බන්ධව සාවධානව කන් දිය යුතු බවත්;

(iii) විශ්වවිද්‍යාලයන්හි පහසුකම් වැඩි කළ යුතු බවත්;

(iv) ශිෂ්‍යයන්ගේ අනාගත රැකියා අපේක්ෂාව සුරක්ෂිත කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) විශ්වවිද්‍යාල තුළ ඇති වන ශිෂ්‍ය අරගල අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේනම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග හරහා ශිෂ්‍ය අරගල අවම වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1043/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගී වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1622/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාවේ සීනි අවශ්‍යතාවය සපුරාලීමේදී සෙවනගල සීනි කර්මාන්තශාලාව ඉතා වැදගත් වන බවත්;

(ii) එමඟින් විශාල වක්‍ර හා සෘජු රැකියා අවස්ථා සංඛ්‍යාවක් බිහිවී ඇති බවත්;

(iii) දැනට මෙම කර්මාන්තශාලාව ආශ්‍රිතව ලබා දී ඇති ඉඩම්වල ගොවීන් උක් වගා නොකර වෙනත් වගාවන් සඳහා යොමු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතව උක් වගාව සඳහා ගොවීන් වෙත වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) දැනට උක් වගාව සිදු කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) දිනෙන් දින උක් ගොවියා වෙනත් වගාවන් සඳහා යොමු වීමෙන් එම කර්මාන්තශාලාවෙන් අපේක්ෂිත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි විය හැකි බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මෙම කර්මාන්තශාලාවෙන් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1639/’17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් නමැති සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත වරින් වර සපයා ඇති මුළු ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) එම ගල් අඟුරු වෙනුවෙන් ඉහත සමාගමට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම සමාගම විසින් නිසි වේලාවට ගල් අඟුරු සැපයීමට අසමත් වීම හේතුවෙන් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට සිදු වූ කාලය කොපමණද;

(iv) එසේ විදුලි ජනක යන්ත්‍ර අත්හිටුවීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය විසින් ලබාගෙන ඇති අංක LCC/09/T/02, LCC/01 සහ LCC/13/T/01 දරන ටෙන්ඩරවලට අදාළව ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය නොතකා ඉහත කී ගල් අඟුරු සැපයීම් එකී සමාගමට ලබාදීමට හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1642/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාතේ ඇති මුළු පන්සල් සංඛ්‍යාව සහ ඒවායේ වැඩවසන මුළු භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් ඌව පළාතේ පන්සල් පද්ධතිය දැඩි බිඳ වැටීමකට ලක්වූ බව පිළිගන්නේද;

(iii) ඓතිහාසික වශයෙන් ඌව පළාතට සිදු වූ බරපතල අසාධාරණය හේතුවෙන් බිඳ වැටුනු පන්සල් පද්ධතිය යළි නඟා සිටුවීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1670/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන මාරවිල රෝහලේ මේ වනවිට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව, තනතුරු අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම රෝහල තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1685/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නම්, අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1691/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී වගාවෙහි නිරතව සිටින ගොවීන්ට පසුගිය කාලයේ සහන මිලට පොහොර ලබාදීමේදී, ගොවීන් පොහොර හොන්ඩරයක් සඳහා කුඹුරු රක්ෂණය වෙනුවෙන් රු. 150/-ක් බැගින් ගෙවූ බවත්;

(ii) ඉහත රක්ෂණ මුදල ගෙවූ ගොවීන්ගේ, කුඹුරු හානිවූ විට ඒ සඳහා වන වන්දි මුදල් පහසුවෙන් ලබාගත් බවත්;

(iii) වර්තමානයේ ඉහත සඳහන් රක්ෂණ මුදල් අයකිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක නොවන බවත්;

(iv) මෑතක සිට නොකඩවා සිදුවන කාලගුණ වෙනස්වීම් හේතුවෙන් වී වගාවට සිදුවන විශාල හානි සම්බන්ධයෙන් ගොවීන්ට වන්දි මුදල් ලබා දීමේදී ප්‍රමාදයන් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පීඩාවට පත් ගොවීන්ට වන්දි මුදල් ගෙවීමට යම්කිසි ක්‍රමවේදයක් තිබේද;

(ii) පෙර පැවති ආකාරයට කුඹුරු ඉඩම් රක්ෂණය වැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 සැප්තැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

387/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරින් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

952/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රාජ්‍ය සේවකයන්ට සහන මිලට යතුරුපැදි ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ තැපැල්කරුවන්ද යතුරුපැදි ඉල්ලා ඇති බවත්;

(ii) ඔවුන්ට මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට සහන මිලට යතුරුපැදි ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1101/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.01.08 වැනි දිනෙන් පසුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත නිවාස ඉදිකිරීමේදී නිවාස ණය ලෙස ලබා දී ඇති මුදල කොපමණද;

(iv) එම නිවාස ණය, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.08 දිනෙන් පසුව අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති ආධාරලාභී නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම මුදල, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.08 දිනෙන් පසුව අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති නිවාස ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම මුදල, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1125/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත, 2010 වර්ෂයේ සිට මේ දක්වා බදුල්ල දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලැබූ බස් නැවතුම්පොළ සංඛ්‍යාව කොපමණද;

(ii) සංවර්ධනය කරනු ලැබූ බස් නැවතුම්පොළවල නම් කවරේද;

(iii) එක් එක් බස් නැවතුම්පොළ සඳහා වියදම් කරනු ලැබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට යෝජිත බදුල්ල දිස්ත්‍රික්කයේ සෙසු බස් නැවතුම්පොළවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1146/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු බටහිර ඕඩ්ඩමාවඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරී වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1153/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමාගම හා බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශ දෙකටම අයත් අක්කර 98 ක වපසරියකින් යුත් බදුවිල වත්ත ඉඩමේ සංචාරක නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අනුමතිය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගමේ නම හා ලිපිනය කුමක්ද;

(iii) එම නිවාස ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශයේ බලවත් පාරිසරික හානියක් සිදුවන බව දන්නේද;

(iv) එම නිවාස ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා පරිසර අධ්‍යයන වාර්තාවක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1278/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2015.10.01 දිනට අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය සතුව පවතින සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2016.06.11 වනවිට එම සමිතිය සතුව තිබූ ස්ථිර තැන්පතු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඉහත කී සමිතියෙන් ණය අයදුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය අයදුම්කරුවන් අතරින්, ණය අනුමත වූ නමුත්, මෙතෙක් ණය මුදල් මුදා හැර නොමැති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ණය අයදුම්කරුවන්ට ගෙවිය යුතුව ඇති ණය මුදල්වල එකතුව කොපමණද;

(vi) එකී ණය අයදුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(vii) ඉහත කී සමිතිය තම සාමාජිකයන් වෙත නිසි ලෙස ණය මුදල් මුදා හැරීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති බව දන්නේද;

(viii) එසේ නම්, එම සමිතියේ මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1350/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලාංකීය ශිෂ්‍යයන්ට බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තිබූ අවස්ථා අඩු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) 2016 වර්ෂයේ බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීමට අනුමත කරනු ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව ගැහැණු, පිරිමි ලෙස සහ එක් එක් උපාධි පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂයන්හිදී උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2014, 2015 සහ 2016 වර්ෂයන්හිදි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iv) සඳහන් ශිෂ්‍යයන් විසින් හදාරනු ලබන උපාධි පාඨමාලාවන් කවරේද;

(vi) එම එක් එක් පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) ඉහත (v) සහ (vi) සඳහා පිළිතුරු නොදෙන්නේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1360/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා, 2015 වර්ෂයේදී ප්‍රථම වරට අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිට, ඉන් ඉතා උසස් ප්‍රතිඵල ලබා සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයන් මේ දක්වා කිසිදු විශ්වවිද්‍යාලයකට ඇතුළත් කරගෙන නොමැති බවත්;

(ii) ඉහත ශිෂ්‍යයන්ට ලබාදුන් විශ්වවිද්‍යාල අත්පොතෙහි එම විෂයට අදාළ උපාධි පාඨමාලාව සඳහා සබරගමුව විශ්වවිද්‍යාලය ඇතුළත් කර තිබුනද, එම විශ්ව විද්‍යාලයටද මේ දක්වා කිසිදු ශිෂ්‍යයෙකු ඇතුළත් කරගෙන නොමැති බවත්;

(iii) මෙම ශිෂ්‍යයන්ට ලැබී ඇති තොරතුරු අනුව කොළඹ වැනි පහසුකම් සහිත දිස්ත්‍රික්කවලින් අඩු Z අගයක් යටතේ සිසුන් 80 - 90 වැනි සංඛ්‍යාවකට විශ්ව විද්‍යාල වරම් හිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ශිෂ්‍යයන්ට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරයාට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටද අභියාචනා ඉදිරිපත් කළද මේ වනතෙක් කිසිදු සාධාරණයක් ඉටු වී නොමැති බව පිළිගන්නේද;

(ii) අ (i) හි සඳහන් ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1388/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 142 යෝජනාවට අනුව, දේශීය කිරි නිෂ්පාදනය සඳහා අවම ආයෝජනය රුපියල් මිලියන 25කට යටත්ව පෞද්ගලික ආයෝජකයන්ට ඌන උපයෝජිත රජයේ ඉඩම් ලබා දීමට අදහස් කළ බව පිළිගන්නේද;

(ii) ඉහත යෝජනාවට අනුව රජයේ ඉඩම් ඉල්ලුම් කළ සමාගම් හෝ පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iii) භාවිතයට නොගත් හා ඌන උපයෝජිත රජයේ ඉඩම් පිළිබඳ ලැයිස්තුවක් සභාගත කරන්නේද;

(iv) බාහිර ගොවීන් ලවා ඉහළ ඵලදායිතාවයෙන් යුත් තෘණ වගා කිරීම සඳහා ඉහත ඉඩම්වලින් ලබා දුන් අක්කර ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1506/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016.12.31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රීය ගිණුම් සංඛ්‍යාව අනුව පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය කොපමණද;

(ii) 2014.12.31 සහ 2015.12.31 දිනයන්ට සාපේක්ෂව, 2016.12.31 දිනට සේවා නියුක්තිය ඉහළ යෑම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1548/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012, 2013 සහ 2014 වර්ෂවලදී කුඩා වාරිමාර්ග සංවර්ධනය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට වෙන් කරන ලද ප්‍රතිපාදන, එක් එක් ගොවිජන සේවා කොට්ඨාසය සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රතිපාදන යොදා ගනිමින් සංවර්ධනය කරන ලද වැව් සහ ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මෙම සංවර්ධන කටයුතු හේතුවෙන් වී අස්වැන්නෙහි ඉහළ යෑමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) වැය කරන ලද ප්‍රතිපාදනවලට අනුව මෙම නිෂ්පාදන ඉහළ යෑම ප්‍රමාණවත් වන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත වර්ෂයන්හිදී දියත් කරන ලද වැඩසටහන් නිවැරදි ආකාරයෙන් සිදු නොවූ බවට ගොවීන් විසින් චෝදනා නඟන බැවින්, මෙම සංවර්ධන කටයුතු පිළිබඳව පසු විපරම් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම විස්තර කවරේද;

(iii) නොඑසේ නම්, මෙම සංවර්ධන කටයුතු පිළිබඳව පසු විපරම් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1586/'17

ගරු සන්දිත් සමරසිංහ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සබරගමුව ප්‍රධාන අමාත්‍යවරයා භාවිතා කරන වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාහනයේ වර්ගය හා අංකය කවරේද;

(iii) එම එක් එක් වාහනයේ නඩත්තු කටයුතු සඳහා වැයකළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ප්‍රධාන අමාත්‍යවරයා විසින් වාහන අවභාවිතාවයක් සිදුකර ඇත්නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1600/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඇති බලාගාර තුනෙහි ආයු කාලය අවසන් වන වර්ෂය කවරේද;

(ii) එම බලාගාරයන්හි ආයු කාලය අවසන් වීමෙන් පසු එම බලාගාර තුනෙන් ලැබුණු බලශක්තිය ලබා ගැනීමේ විකල්ප ක්‍රමවේදය කවරේද;

(iii) එම බලාගාරයන්හි නිරන්තරයෙන් මතුවන තාක්ෂණික අර්බුද පිළිබඳව සලකා බැලීමේදී නියමිත කාලයට පෙර එම බලාගාර භාවිතයෙන් ඉවත් කිරීම මඟින් සිදු විය හැකි තත්ත්වය පිළිබඳව, දිගුකාලීන ජනන සැලැසුම් සකස් කරනු ලබන සැලසුම් සම්පාදකයන්ගේ අවධානය යොමු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1675/'17

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (2)

(අ) 2008 දෙසැම්බර් මාසයේදී මඩකලපුව, කෝපායි සහ කොටගල යන ගුරු පුහුණු විද්‍යාලවලින් තම පුහුණුව නිමකර වන්නි දිස්ත්‍රික්කයේ පාසල්වලට පත්වීම් ලබාදෙන ලද පුහුණුව අවසන් කළ වහාම විභාගය පැවැත්වීමේ ක්‍රියාපටිපාටියට පටහැනි ලෙස 2009 අප්‍රේල් මාසයේදී අවසන් විභාගයට පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ අභ්‍යාසලාභීන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී දිස්ත්‍රික්කය තුළ යුද්ධය උච්චතම අවස්ථාවට එළඹ තිබූ හෙයින් එම අභ්‍යාසලාභීන්හට දිස්ත්‍රික්කයෙන් පිටතට පැමිණීමට නොහැකි වූ බවත්;

(ii) ඔවුන් තම කණිෂ්ඨ කණ්ඩායම සමඟ විභාගයට මුහුණදුන් අතර එම කණිෂ්ඨ කණ්ඩායමට ලබාදුන් ප්‍රශ්න පත්‍රයටම පිළිතුරු ලබා දුන් නමුත්, කණිෂ්ඨ කණ්ඩායම සඳහා තම සහතිකය වලංගු වන දිනය ලෙස 2009.08.01 දින ලබාදුන් අතර ඔවුන්ගේ සහතිකය වලංගු වන දිනය 2011.01.01 ලෙස වෙනස් දිනයක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) කණිෂ්ඨ කණ්ඩායමේ සහතිකය වලංගු වන දිනයම ඔවුන්හට ලබාදීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 සැප්තැම්බර් මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

892/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුලාවෙල්ලිය ග්‍රාමය ආශ්‍රිතව දිවි ගෙවන "වන්නි සිංහල" නම්, ජන වර්ගය පිළිබඳව සමීක්ෂණයක් කර තිබේද;

(ii) උක්ත ග්‍රාමයට අමතරව මෙම ජන වර්ගය ජීවත්වන වෙනත් ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) යුද සමයේදී විවිධ පීඩාවන්ට ලක්වූ මෙම ජනතාව දිවිගෙවන ගම්මානයන්හි මූලික අවශ්‍යතා අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iv) එම පහසුකම් කඩිනමින් ලබා දීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) මෙම ජනතාවගේ සාම්ප්‍රදායික උරුමයන් ආරක්‍ෂා කිරීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1215/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983 න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට, වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1391/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයෙහි ජලජීවී වගා කලාපයක් පිහිටුවීමේ දැවැන්ත ව්‍යාපෘතියෙහි මූලික කටයුතු වෙනුවෙන් 2016 අයවැය යෝජනා අංක 151ට අනුව වෙන් කරන ලද රුපියල් මිලියන 100ක ප්‍රතිපාදනයෙන්, වර්ෂාවසානය වනවිට මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් මුදල කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා වූ ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iv) 2017 වර්ෂයේදී මෙවැනි ජලජීවී වගා කලාප දිවයිනෙහි අනෙකුත් ප්‍රදේශවලත් ආරම්භ කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1468/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එක් පළාත් පාලන ආයතනයකට ලබා දුන් අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(v) වත්මන් යහපාලන රජය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1501/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, "සමීරගම ආදර්ශ ගම්මානය" පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගනු ලැබූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එහි ඉඩම්ලාභීන් වශයෙන් තෝරාගත් පවුල් සංඛ්‍යාව සහ එම ඉඩම්ලාභීන් අතරින් දැනට ස්ථිර පදිංචිකරුවන් ලෙස හඳුනාගෙන සිටින පවුල් සංඛ්‍යාව හා අනු පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පදිංචිකරුවන් අතරින් හඳුනාගත් අනු පවුල් සඳහා ස්ථිර පදිංචියට ඉඩම් කට්ටි ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(v) ඉඩම්ලාභීන් සඳහා ස්ථිර ඔප්පු ප්‍රදානය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1513/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014, 2015 සහ 2016 වර්ෂවලදී ශ්‍රී ලංකාවේදී මියගිය විදේශිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විදේශිකයන් මියයෑමට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1545/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභීන්ගේ නිවාස අලුත්වැඩියා කර ගැනීම සඳහා රු.2500/-ක මුදලක් ප්‍රදානයක් ලෙස ලබා දී තිබේද;

(ii) එම මුදල දිවිනැගුම ප්‍රජාමූල බැංකුවෙන් ලබා දෙනු ලැබුවේ භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපූරණය කිරීමේ පදනම මතද;

(iii) එසේ නම්, මේ වනවිට එම මුදල ප්‍රතිපූරණය කර තිබේද;

(iv) නිවාස අලුත්වැඩියා කිරීම සඳහා මුදල් ලබා ගත් පුද්ගලයන්ගෙන් එම මුදල නැවත අයකර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1549/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කින්නියා, එළිලරංගු ක්‍රීඩාපිටිය පසුගිය වසර කිහිපයක සිට සංවර්ධනය කරමින් පවතින බවත්;

(ii) එහි සංවර්ධන කටයුතු සඳහා වෙන්කරන ලද මුදල කොපමණද;

(iii) ඒ හරහා සිදුකරනු ලබන වැඩකටයුතු කවරේද;

(iv) ඉහත කටයුතු පිළිබඳ එහි සිටින රාජ්‍ය නිලධාරීන් නොදන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එළිලරංගු ක්‍රීඩාපිටියේ සංවර්ධන කටයුතු සඳහා වර්ෂ 2011 සිට 2015 දක්වා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එමඟින් සිදුකරන ලද සංවර්ධන කටයුතු කවරේද;

(iii) උක්ත සංවර්ධන කටයුතු පිළිබඳව ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ නැගෙනහිර පළාත් සභාව හෝ නොදැනුවත්ව අමාත්‍යාංශය විසින් ඍජුව කටයුතු කරනු ලැබීමට හේතුව කවරේද;

(iv) සංවර්ධන කටයුතු සිදුකරනු ලබන කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(v) එම කොන්ත්‍රාත්කරුට වැඩ පවරා ඇති පදනම කවරේද;

(vi) දීර්ඝ කාලයක් ගතවී ඇතත්, සංවර්ධන කටයුතු තවමත් සම්පූර්ණ නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) යහපාලන රජය යටතේ සිදුකරනු ලබන සියලුම සංවර්ධන වැඩකටයුතු පිළිබඳව විනිවිද භාවයක් පැවතීම තහවුරු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1575/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නම හා ලිපිනය කවරේද;

(ii) ඔහුට හිමි වැටුප් හා දීමනා කවරේද;

(iii) එම සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ නම හා ලිපිනය කවරේද;

(iv) ඔහුට හිමි වැටුප් හා දීමනා කවරේද;

(v) උක්ත තනතුරු දෙකම එක් පුද්ගලයකු විසින් දැරීමට හේතු කවරේද;

(vi) තනතුරු දෙකක් එක් පුද්ගලයකු විසින් දැරීම සුදුසු නොවන බව මුදල් අමාත්‍යාංශය විසින් දැනුම් දී තිබේද;

(vii) එසේ නම්, එම උපදෙස් පිළිනොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1581/'17

ගරු විදුර වික්‍රමනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදා රෝහලේ සිවිල් කටයුතු සිදුකරනු ලබන සිවිල් සේවකයන් වශයෙන් පත්වීම් ලැබූවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත් බව ඔවුන් වෙත ලබා දී ඇති පත්වීම් ලිපියේ සඳහන් කර ඇති බවත්;

(ii) එසේ වුවද, සේවා අවශ්‍යතාවය මත මෙම සේවකයන් දිනකට සීමා රහිත කාලයක් සේවය කරන බවත්;

(iii) එසේ අතිරේක කාලයක් සේවය කළද ඔවුනට අතිකාල දීමනා හෝ වෙනත් දීමනාවක් නොගෙවන බවත්;

(iv) එසේ වුවද, හමුදා කඳවුරුවල සේවය කරන සිවිල් සේවක කණ්ඩායම් සඳහා මාසයක කාලයක් තුළ පැය සියයක් නොඉක්මවන අතිකාල දීමනා ගෙවීම් කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ ආකාරයට එක් කණ්ඩායමකට අහිමි වී ඇති අතිකාල දීමනා ඔවුන් වෙත ද ගෙවීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1587/'17

ගරු සන්දිත් සමරසිංහ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් ලබා දී ඇති මගී ප්‍රවාහන බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මගී ප්‍රවාහන බලපත්‍ර නොමැතිව සබරගමුව පළාතේ බස් රථ ධාවනය වන බවත්;

(ii) එමඟින් සබරගමුව මගී ප්‍රවාහන අධිකාරියට විශාල පාඩුවක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1589/'17

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල සිට හබරණ දක්වා නව දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, සැලසුම සකස් කළ වර්ෂය සහ ඒ සඳහා මූලික වූ තාක්ෂණවේදීන් කවුරුන්ද;

(iii) එම සැලසුමට අනුව හානි සිදුවන ආගමික මධ්‍යස්ථාන, රජයේ ගොඩනැගිලි, පෞද්ගලික ආයතන සහ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙහි මුල් සැලැස්ම ඉබ්බාගමුව, දඹුල්ල ඇතුළු ප්‍රදේශවලින් වෙනස් කළේද;

(v) එසේ නම්, එම වෙනස සිදු කළ වර්ෂය කවරේද;

(vi) ඒ සම්බන්ධයෙන් අදාළ ජනතාවට දැනුම් දුන්නේද;

(vii) එසේ නම්, ඒ කවර කාලයේද;

(viii) එම ජනතාව සමඟ එකඟතාවයකට පැමිණියේද;

(ix) එම වෙනස සිදු කළ හේතුව කවරේද;

(x) මෙම වෙනසට භාජනය වූ දුර ප්‍රමාණය කොපමණද;

(xi) මුල් සැලැස්ම හා සංසන්දනාත්මකව දෙවැනි සැලැස්මෙන් ඉබ්බාගමුව හා දඹුල්ල ප්‍රදේශ තුළ සිදුවන දේපළ හානිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(xii) දෙවැනි සැලැස්ම සකස් කළ තාක්ෂණ කමිටු සාමාජිකයන් කවුරුන්ද;

(xiii) මෙම සැලසුම් දෙක සකස් කිරීම සඳහා මෙතෙක් කර ඇති වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1596/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතට අනුමත ආහාර පරීක්ෂකවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවයේ නියුතු ආහාර පරීක්ෂකවරයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

(iii) දැනට එම තනතුරු පුරප්පාඩුව පවතී නම්, ඒ සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අමාත්‍යාංශය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1616/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්ථානගත කර ඇති යුධ හමුදා කඳවුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම කඳවුරු ස්ථානගත කිරීමට ස්ථිර ඉඩම් ලබාදී තිබේද;

(iii) ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැව ආශ්‍රිතව ඇති හමුදා කඳවුර සඳහා ඉඩම් ලබාදී ඇති පදනම කවරේද;

(iv) මෙම ඉඩමේ අයිතිකරු කවුරුන්ද;

(v) මෙම ඉඩම තුළ හමුදා කඳවුරක් ඉදිකිරීම තුළින් ඒ ආශ්‍රිත ජනතාවටත්, චන්ද්‍රිකා වැව දෛනිකව ප්‍රයෝජනයට ගන්නා ජනතාවටත් දැඩි හිරිහැරයක් වන බව පිළිගන්නේද;

(vi) වැව් රක්ෂිතය තුළ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ අවසර ලබාගෙන තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා අවසර ලබා දී ඇති ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1677/'17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ බටහිර සහ කල්කුඩා අධ්‍යාපන කලාපවල තිබෙන පාසල්වල නම්, ගුරු වර්ගය අනුව එක් එක් පාසලේ සිටිය යුතු ගුරුවරු සංඛ්‍යාව සහ දැනට සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) මෙම දිළිඳු ග්‍රාමීය සිසුන්ට නිදහස් අධ්‍යාපනය සඳහා පවතින සමාන අයිතිවාසිකම් සහතික කිරීම පිණිස පවත්නා පුරප්පාඩු පිරවීමට යාබද අධ්‍යාපන කලාපවල අතිරික්ත ගුරුවරුන් මාරු කරන ලෙස නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

පා.10 /'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා.11/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා.12/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා.13/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා.14/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා.15/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා.16/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා.17/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවම කිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා.18/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා.19/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා.21/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා.22/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා ඍජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා.23/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා.24/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා.25/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා.26/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා.27/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා.28/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා.29/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා.30/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා.31/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා.32/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා.33/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා.34/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා.35/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා.36/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා.37/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා.38/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

29.

පා.39/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

30.

පා.40/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

31.

පා.41/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

32.

පා.42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

33.

පා.43/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

34.

පා.44/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

35.

පා.45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

36.

පා.46/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

37.

පා.47/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

38.

පා.48/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

39.

පා.49/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මඟින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

40.

පා.50/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු

අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

41.

පා.51/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මඟින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

42.

පා.52/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

43.

පා.53/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

44.

පා.54/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

45.

පා.55/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

46.

පා.56/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

47.

පා.57/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

48.

පා.58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රික විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

49.

පා.59/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායී මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරී මඟින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

50.

පා.60/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

51.

පා.61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

52.

පා.62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

53.

පා.63/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

54.

පා.64/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

55.

පා.65/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මග පෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

56.

පා.66/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

57.

පා.67/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

58.

පා.68/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

59.

පා.69/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙලීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මඟින් ඖෂධ මිල පහත හෙලීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

60.

පා.70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

61.

පා.71/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

62.

පා.72/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

63.

පා.73/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායීතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායීතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායීතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

64.

පා.74/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

65.

පා.76/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳපොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

66.

පා.77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

67

පා.78/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයන් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

68.

පා.79/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

69.

පා.80/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

70.

පා.81/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

71.

පා.82/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

72.

පා.83/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

73.

පා.84/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

74.

පා.85/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

75.

පා.86/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

76.

පා.87/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

77.

පා.88/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

78.

පා.89/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

79.

පා.90/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

80.

පා.91/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

81.

පා.92/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

82.

පා.93/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

83.

පා.94/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

84.

පා.95/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

85.

පා.96/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

86.

පා.97/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබාදීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

87.

පා.98/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

88.

පා.99/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මඟින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

89.

පා.100/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මඟින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

90.

පා.101/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

91.

පා.102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මඟින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පලිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

92.

පා.103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ඩ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

93.

පා.104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

94.

පා.105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

95.

පා.106/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුලු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

96.

පා.107/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

97.

පා.108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

98.

පා.109/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

99.

පා.110/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මඟින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

100.

පා.111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

101.

පා.112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නිරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

102.

පා.113/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

103.

පා.114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමඟ පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

104.

පා.115/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

105.

පා.116/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්ව් ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

106.

පා.117/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

107.

පා.118/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

108.

පා.119/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

109.

පා.120/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

110.

පා.121/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

111.

පා.122/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

112.

පා.123/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

113.

පා.124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

114.

පා.125/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

115.

පා.126/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

116.

පා.127/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

117.

පා.128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමඟ සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

118.

පා.129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණින්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව

අභාවයට ගිය බැවින්, මෑත යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුලු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

119.

පා.130/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිචාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

120.

පා.131/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

121.

පා.132/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

122.

පා.133/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

123.

පා.134/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වැන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

124.

පා.135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල් සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

125.

පා.136/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මඟින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

126.

පා.137/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

127.

පා.138/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම,— රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

128.

පා.139/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

129.

පා.140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

130.

පා.156/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පවත්නා මාර්ග තදබදය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ දෙවැනි අගනගරය වන මහනුවර නගරය දේශීය හා විදේශිකයන්ගේ සංචාරක මධ්‍යස්ථානයක් වන හෙයින් ද, මහනුවර නගරයට එදිනෙදා විශාල පිරිසක් පැමිණෙන අතර එම ජනතාව මහනුවර නගරයේ හා අවට මාර්ගවල ඇති අධික රථ වාහන තදබදය නිසා මහත් අසීරුතාවයකට පත්වන බැවින් ද, මහනුවර නගරයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

131.

පා.157/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

132.

පා.158/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

133.

පා.159/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

134.

පා.160/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රීය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

135.

පා.169/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නව ක්‍රීඩා පනතක් හඳුන්වාදීම,— දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වල ඡන්දයෙන් ක්‍රීඩා පාලක මණ්ඩලවලට නිලධාරින් තේරී පත්වීමේ ක්‍රමය වෙනුවට අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දී, එමගින් එම නිලධාරීන්ගේ ක්‍රියා කලාපය, මහජනතාවට හෝ පාර්ලිමේන්තුවට හෝ වගකියන අයුරින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දියුණුව සහ අභිවෘද්ධිය සඳහා නව ක්‍රීඩා පනතක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

136.

පා.183/'16

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— රැකියා ලක්ෂ දහයක් ලබාදීමේ ව්‍යාපෘතියෙහිදී උතුරු හා නැගෙනහිර පළාත්වල තරුණ තරුණියන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම,— රැකියා ලක්ෂ දහයක් ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වන, වයස අවුරුදු තිස්පහ සිට හතලිස් පහ දක්වා තරුණ තරුණියන්ට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවත්, ප්‍රාථමික, ද්විතියික සහ ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටම්වලදී පාසල් අතහැර ගිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) සුදුසුකම් සහිතව පාසල්වල ස්වේච්ඡා ගුරුවරුන් ලෙස වසර විස්සකට වඩා වැඩකරන අයට, උසස් අධ්‍යාපන සුදුසුකම් නොසලකා ස්ථිර පත්වීම් ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

137.

පා.184/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්ධනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

138.

පා.185/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු අධ්‍යයන කේන්ද්‍රයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාවේ හා ලෝකයේ විවිධ රටවල පාර්ලිමේන්තු ක්‍රියාදාමයන්, පාර්ලිමේන්තු ඉතිහාසය හා දේශපාලන ක්‍රමවේද පිළිබඳ පාසල් සිසුන්ට, තරුණ තරුණියන්ට හා අනෙකුත් විද්‍යාර්ථයන්ට අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැලසිය හැකි අධ්‍යයන කේන්ද්‍රයක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

139.

පා.191/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

140.

පා.192/'17

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

141.

පා.193/'17

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— සියලුම විශ්වවිද්‍යාලවල දැනට පවතින නවක වදය සම්පූර්ණයෙන් නැවැත්වීම සඳහා පවතින නීති ක්‍රියාත්මක කිරීම,— විශ්වවිද්‍යාල තුළ හෝ ඉන් පිටත නවක සිසුන්ට මුහුණ දීමට සිදුවන නවක වදය සම්පූර්ණයෙන්ම වැළැක්වීම හා 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ප්‍රකාරව, එසේ නවක වදය ක්‍රියාත්මක කරන සියලුම පාර්ශ්වයන්ට නීතිය ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

142.

පා.194/'17

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

143.

පා.195/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම,— දශක ගණනාවක සිට උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය තුරන් වී සාමකාමී ජීවන රටාවකට ජනතාව දැන් අවතීර්ණ වී සිටින අතර පසුගිය කාලයේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් නිසා ද, යුදමය වාතාවරණය හේතුවෙන් ද, ඝාතනයට ලක්වූ සියලු ජාති, ආගම් හා සමාජවලට අයත්, සියලුම භාෂාවන් කතාකරන ජනතාව, ශ්‍රී ලාංකිකයින් ලෙස සිහිපත් කරමින්, එම ජනතාව මිචිබිම වෙනුවෙන් ද, ඔවුන් කළ පරිත්‍යාගයන්වලට ගෞරව කිරීම සඳහා ද, උතුරු පළාතේ ඕමන්තේ ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක "අනුස්මරණ ස්මාරකයක්" තැනීමට ද, එම යුදමය තත්ත්වය නිසා දිවි අහිමි වූ සියලුම ජාති, ආගම් හා භාෂාවන් කථා කරන ජනතාව සිහිගැන්වීම සඳහා සුදුසු දිනයක් නම් කොට සෑම වසරක් පාසාම එම දිනය සැමරීමට ද රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2017 සැප්තැම්බර් මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

893/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, පානම ගම්මානයේ, ජීවත්වන සිංහල හා දෙමළ ජනතාව ඉතා සහජීවනයෙන් ජීවත් වන බවත්;

(ii) එම ජනතාවට තම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පානම ප්‍රදේශයේ ජනතාවගේ ජලය හා ඉඩම් ආශ්‍රිතව පවතින ගැටලු විසඳීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහ ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1270/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනවාරි 08 වැනි දිනට පෙර මොණරාගල දිස්ත්‍රික්කයේ එක් එක් කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් දේශපාලන පළිගැනීම්වලට ලක්වූ ගුරුවරුන් සිටියේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් පුද්ගලයන්ට පළිගැනීම්වලට අදාළ නිර්දේශයන් නිකුත් කර තිබේද;

(iv) එම ලේඛනයේ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1351/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දුම්රිය දෙපාර්තමේන්තුව සතු මුළු ඉඩම් ප්‍රමාණය, එක් එක් නගරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)හි සඳහන් මුළු ඉඩම් ප්‍රමාණයෙන් බදු පදනම යටතේ හෝ අන් කවර හෝ පදනමක් යටතේ මේ වනවිට දෙපාර්තමේන්තු භාවිතයෙන් ඉවත්ව ඇති ඉඩම් වලට අදාළ,

(i) වපසරිය;

(ii) භූගෝලීය බලප්‍රදේශය;

(iii) පදනම;

(iv) දෙපාර්තමේන්තු භාවිතයෙන් ඉවත් වූ දිනය;

අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු දීමට, විකිණීමට හෝ දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර කිරීම සඳහා මේ වනවිට කිසියම් තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් කවරේද;

(iii) අදාළ ඉඩම් බැහැර කිරීමේ පදනම කවරේද;

(iv) බදු පදනම යටතේ බැහැර කොට ඇති ඉඩම් පර්චස් එකක් සඳහා දැනට අය කෙරෙන මාසික බදු මුදල කොපමණද;

(v) බදු ගෙවීම පැහැර හැර ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(vi) බදු ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධයෙන් ගනු ලබන නෛතික පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1407/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 183 යෝජනාවට අනුව, අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි, පිහිටුවීමට යෝජනා කරන ලද විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපවලින්, 2016 වර්ෂය තුළ පිහිටවනු ලැබූ කලාප සංඛ්‍යාව සහ ඒවා පිහිටවූ ස්ථාන කවරේද;

(ii) උක්ත යෝජනාවට අනුව පිහිටවූ එක් එක් කලාපයක් වෙනුවෙන් රජය විසින් දරනු ලැබූ මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපයන්හි වගකීම දරන්නේ කවර රාජ්‍ය ආයතනයක් විසින්ද;

(iv) 2016 වර්ෂය තුළ එවැනි කලාප පිහිටවනු ලැබුවේ නම්, එම එක් එක් කලාපයක අපනයන ඉපයුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1467/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල පීඩාවකට ලක් වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව හා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) එම ව්‍යාපෘතියෙන් පීඩාවට පත් වූ ජනතාවට වහා සහන ලබාදෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම අධිකරණ නියෝගයට අනුව, උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියෙන් පීඩාවට පත් වූ ජනතාවට සහන ලබාදීම සඳහා අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1514/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වර්ෂ 2013 සිට 2016 දක්වා කාලය තුළ අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ත්‍රස්තවාදී සැකකරුවන්ට එරෙහිව තිබෙන චෝදනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1571/'17

ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ ජාතික පාසල් සඳහා අනුමත විදුහල්පතිවරුන් සංඛ්‍යාව කවරේද;

(ii) ජාතික පාසල්වල දැනට සේවය කරන විදුහල්පතිවරුන්ගේ නම් සහ ඔවුන්ගේ ශ්‍රේණි කවරේද;

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය ඇතිව ජාතික පාසල්වල සේවයට යොදවා ඇති විදුහල්පතිවරුන්ගේ නම් කවරේද;

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතියෙන් තොරව ජාතික පාසල්වලට පත්වීම් ලැබූ විදුහල්පතිවරුන්ගේ නම් සහ එම පත්වීම් අනුමත කළ නිලධාරියාගේ නම කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා හැර වෙනත් නිලධාරියකු විසින් ජාතික පාසල්වල විදුහල්පතිවරුන්ට පත්වීම් ලිපි නිකුත් කිරීම නිසි පිළිවෙළ වන්නේද;

(ii) මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලබන්නේද;

(iii) එසේනම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1579/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් චීන ආධාර මත කිතුල්ගල, කළුකොහුතැන්න ප්‍රදේශයේ බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය ඉදිකිරීමට පියවර ගන්නා ලද බව දන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා රජයට පවරා ගන්නා ලද ඉහත සඳහන් ග්‍රාමයේ පදිංචිකරුවන්ගේ ඉඩම් සඳහා සුදුසු පරිදි වන්දි ලබාදෙන බවට පොරොන්දු වූ අතර නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ට වන්දි ලබාදුන් නමුත්, කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ට ගෙවා ඇත්තේ ඉතාමත් සුළු වන්දියක් බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් සොයා බලා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් පදිංචිකරුවන්ටද ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1590/'17

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයේ මුල් සැලැස්ම වෙනස් කිරීමට මෙතරම් කාලයක් ගත වූයේ මන්ද;

(ii) මෙම වෙනස තුළින් ගම්‍ය වන්නේ පරණ සැලැස්ම අසාර්ථක බවද;

(iii) එසේ නම්, එය වටහා ගැනීම සඳහා මෙතරම් කාලයක් ගත වූයේ මන්ද;

(iv) එම වෙනස තුළ නාස්ති කළ මහජන මුදල් සහ ඊට ගොදුරු වූ ජනතාවට එල්ල කළ පීඩනය සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(v) එම සැලසුම් දෙක සවිස්තර වාර්තා සහිතව වෙන වෙනම ඉදිරිපත් කරන්නේද;

(vi) මෙම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ මූලික අවශ්‍යතාවය කවරේද;

(vii) මෙම දුම්රිය මාර්ගයෙන් දේපල හානිවන්නන්ට වන්දි ගෙවන්නේද;

(viii) එසේ නම්, වන්දි ප්‍රමාණය සහ කොන්දේසි කවරේද;

(ix) මුල් සැලස්මට අනුව දේපල අහිමිවන ජනතාවට අදාළ බිමේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කළ නොහැකි වීම, ඉඩම්වල වාණිජ වටිනාකම අඩුවීම සහ ණය වී ඉදි කළ නව නිවාස නඩත්තුව අත්හැරීම වැනි කරුණු හේතුවෙන්, වසර 10කට ආසන්න කාලයක් දැඩි පීඩනයෙන් සිටින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1617/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම පාසල් අතරින් සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් කවරේද;

(iv) පසුගිය සමයේ දේශපාලනික හිතවත්කම් මත සුදුසුකම් නොමැති වැඩබලන විදුහල්පතිවරුන් විශාල ප්‍රමාණයක් පත්කර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1631/'17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් මෙතෙක් ලැබී ඇති සම්පූර්ණ ප්‍රදානයන් සහ ණය ප්‍රමාණයන් කොපමණද;

(ii) එම එක් එක් ණය/ප්‍රදාන ලැබුනු වර්ෂය සහ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ණය/ප්‍රදාන මඟින් පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා ලබාදී ඇති දායකත්වය පිළිබඳ සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1638/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යුහය තුළ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් වගකීම් පැවරූ අංශයක් නොමැති බව දන්නේද;

(ii) පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සඳහා වෙන් වූ විශේෂිත අංශයක් නොමැතිව පුනර්ජනනීය බලශක්ති උපරිම ලෙස ජාතික විදුලි පද්ධතියට එකතු කිරීමේදී මතුවිය හැකි තාක්ෂණික අභියෝග ජය ගත හැකිද;

(iii) පුනර්ජනනීය බලශක්ති පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය දක්වන පසුගාමී ආකල්පයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1687/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ පාසල් 331ක විදුහල්පතිවරුන් නොමැති බවත්; විදුහල්පතිවරුන් ලෙස 252 දෙනෙකු කටයුතු කරන බවත්;

(ii) මෙම වැඩබලන විදුහල්පතිවරුන්, ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත්කොට ඇති බවත්;

(iii) පට්ටිරිප්පු අධ්‍යාපන කලාපයේ, පෝරාතීවුප්පත්තුව කොට්ඨාසයේ 1 ඒ සහ බී ශ්‍රේණියේ පාසල් නොමැති බවත්;

(iv) එම කොට්ඨාසයේ ගණිතය හා විද්‍යාව විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක්ද පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාසල් 331 සඳහා විදුහල්පතිවරුන් පත්කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) වැඩබලන විදුහල්පතිවරුන් 252 දෙනාගේ තත්ත්වය කවරේද;

(iii) පෝරාතීවුප්පත්තුව කොට්ඨාසයට 1 ඒ සහ බී ශ්‍රේණියේ පාසලක් ලබාදිය හැකිද;

(iv) ගණිතය හා විද්‍යාව විෂයයන් සඳහා වූ ගුරු හිඟය පියවීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1698/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ඉඩම්වල වසර 10කට වැඩි කාලයක් පදිංචිව සිටින තැනැත්තන්ට හිමිකම් ඔප්පු ලබාදීම සඳහා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවත්;

(ii) අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2016.10.27 දින මධ්‍යකාලීන ආර්ථික දැක්ම පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් එය නැවත තහවුරු කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2015.01.08 දිනෙන් පසු හිමිකම් ඔප්පු ලබාදී ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට හිමිකම් ඔප්පු ලබාදීම සඳහා හඳුනාගෙන ඇති බිම් කට්ටි ප්‍රමාණය, දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (iii) හි සඳහන් බිම් කට්ටි අතරින් රජය විසින් පිඹුරුපත් සකස් කර ඇති බිම් කට්ටි ප්‍රමාණය, දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ජාතික ආර්ථිකයට ඉතා වැදගත් වන ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අධික ලෙස ප්‍රමාද වී ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1703/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වසීම් තාජුඩීන්ගේ ශරීර කොටස් කිහිපයක් මාළඹේ, නෙවිල් ප්‍රනාන්දු රෝහල තුළ හෝ SAITM ආයතනය තුළ සොයාගෙන හමුවී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ශරීර කොටස් කොළඹ ජාතික රෝහලෙන් රැගෙන යාමට සහ එම ස්ථානයේ තබාගැනීම සඳහා අවසර ලබාගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 සැප්තැම්බර් මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

120/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකිකයන් පිළිකා රෝගයට ගොදුරු වීමේ වැඩි නැඹුරුවක් දක්නට ලැබෙන බවත්;

(ii) මෙම තත්ත්වය පාලනය කිරීමට මෙතෙක් ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවන බවත්;

(iii) මේ නිසා රටේ මානව සම්පත මෙන්ම මුදල්ද විනාශ වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ බහුලවම දක්නට ලැබෙන පිළිකා රෝග කවරේද;

(ii) එම රෝග වැළඳීමට බලපාන ප්‍රධාන හේතු එක් එක් රෝගයට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම හේතු පාලනයට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර 05 තුළ පිළිකා රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා රජය වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර 05 තුළ පිළිකා රෝග මර්ධන වැඩසටහන් සඳහා රජය වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1112/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, අධිකාරි, සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු, ඉහත එක් එක් ආයතනය සඳහා බඳවා ගත් මුළු සේවක සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) දැනට මෙම ආයතනවල සේවක පුරප්පාඩු පවතීද;

(vi) එසේ නම්, ඉදිරියේදී සේවකයන් බඳවා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1204/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු, ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1374/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 128ට අනුව, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගම්වලට, ප්‍රයෝජනයට නොගත් හා ඌන උපයෝජිත රජයේ ඉඩම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම රජයේ ඉඩම් කවරේද;

(iii) ඉහත අයවැය යෝජනාවට අනුව, ඉඩම් ඉල්ලා සිටි සමාගම් කවරේද;

(iv) එම සමාගම්වල කෘෂි නිෂ්පාදන ක්ෂේත්‍රයන් කවරේද;

(v) එම ඉඩම් පවරා දුන් නියමයන් හා කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1515/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2013, 2014, 2015 සහ 2016 වර්ෂවලදී නඩු පැවරූ පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ත්‍රස්තවාදී චූදිතයන්ට එරෙහිව තිබෙන චෝදනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1572/'17

ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ශ්‍රේණි කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් නම් අතරින් ස්ථිර පදනමින්, වැඩබලන පදනමින් සහ රාජකාරි ආවරණ පදනමින් සේවයේ නිරතවන කලාප අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩබලන පත්වීම් ලැබීමට සුදුසුකම් ලත්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සිටියදී එම පත්වීම් රාජකාරි ආවරණ පදනමින් කණිෂ්ඨ නිලධාරීන්ට ලබාදෙන බවත්;

(ii) ඉහත සඳහන් කළ පත්වීම් 2015.08.21 දින දරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා අති විශේෂ ගැසට් අංක 1928/28 හි සඳහන් වන සේවා ව්‍යවස්ථාවලට පටහැනි බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම අක්‍රමිකතාවය නිවැරදි කිරීමට ක්‍රියාකරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1591/'17

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයේ මුල් සැලැස්ම සකසා වසර 10කට පසු එය වෙනස් කර නව සැලැස්මක් සකස් කිරීමෙන් දේපළ අහිමි වන ජනතාවට බලවත් අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) මෙම සැලැස්ම වෙනස් කිරීමට එරෙහිව, මහජන විරෝධයක් පැන නැගී ඇති බව පිළිගන්නේද;

(iii) ඉදිකිරීම් සඳහා සහ වන්දි ලබාදීම සඳහා යෝජිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම මුදල් ලබාදෙන ආයතන සහ ලබාදීමේ පදනම කවරේද;

(v) මෙම දුම්රිය මාර්ගය ඉදිකළ පසු කුරුණෑගල සිට මහව හරහා හබරණ දක්වා ඇති දුම්රිය මාර්ගයේ කාර්යභාරය කවරේද;

(vi) යෝජිත දුම්රිය මාර්ගයෙන් ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(vii) හබරණට විකල්ප දුම්රිය මාර්ගයක් තිබියදී, කුරුණෑගල හරහා අධිවේගී මාර්ගයක්ද ඉදිවන තත්ත්වයක් තුළ යෝජිත දුම්රිය මාර්ගය සඳහා කරන විශාල ආයෝජනය සමඟ සැසඳීමේදී, සාපේක්ෂව ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව සෑහීමකට පත්විය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1618/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ පාසල් තුළ ගුරු හිඟයක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ගුරු හිඟය පියවීම සඳහා ගනු ලබන ඉක්මන් ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

(iv) පළාත් සභා පාසල් සඳහා ගුරුවරුන් මාරු කිරීමේ ක්‍රමවේදය සබරගමුව පළාත තුළ නිසි පරිදි සිදු නොවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1688/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වසරේදී ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් නිවාස විනාශයට පත් වූ නැගෙනහිර පළාතේ වෙරළබඩ ජනතාවට නිවාස ලබාදීම සඳහා සෞදි අරාබි රජයේ මූල්‍යාධාරවලින් නොරච්චෝලේ ප්‍රදේශයේ ආදර්ශ ගම්මානයක් ඉදිකිරීම පිණිස අවබෝධතා ගිවිසුමකට 2006.05.02 දින අත්සන් තබන ලද බවත්;

(ii) ඒ අනුව, අනෙකුත් සියළු පහසුකම් සහිතව නිවාස 500කින් යුතු මෙම ආදර්ශ ගම්මානය ඉදිකරන ලද බවත්;

(iii) මෙම ආදර්ශ ගම්මානයේ නිවාස ආපදාවෙන් විපතට පත් ජනතාවට මේ දක්වා ලබාදී නොමැති බවත්, මේ වනවිට එම ප්‍රදේශය ඝන කැළෑවකින් වසාගෙන ඇති තත්ත්වයක් දක්නට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස, ඒවා ඉදිකරනු ලැබූ අරමුණට අනුව, අදාළ ජනතාවට ලබාදීම සඳහා පියවර ගන්නේද;

(ii) වර්තමාන තත්ත්වය අනුව, මෙම නිවාස යළි අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් ඇති බැවින්, ඒ සඳහා මූල්‍යාධාර ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1699/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ඉඩම්වල වසර 10කට වැඩි කාලයක් පදිංචිව සිටින තැනැත්තන්ට හිමිකම් ඔප්පු ලබාදීම සඳහා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉහත කී ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(iii) 2015.01.08 දිනෙන් පසු හිමිකම් ඔප්පු ලබා දී ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට හිමිකම් ඔප්පු ලබාදීම සඳහා හඳුනාගෙන ඇති බිම් කට්ටි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් බිම් කට්ටි අතරින් රජය විසින් පිඹුරුපත් සකස් කර ඇති බිම් කට්ටි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ජාතික ආර්ථිකයට ඉතා වැදගත් වන ඉහත කී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අධික ලෙස ප්‍රමාද වී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, එම වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1701/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "සවිබලගැන්වීම" යන සංකල්පය කෙසේ නිර්වචනය කරන්නේද;

(ii) ඒ අනුව වාරයකට ප්‍රදේශයකින් 10%ක් බැගින් පවුල් සවිබලගන්වා ඔවුන් සමෘද්ධි ප්‍රතිලාභවලින් බැහැර කරනු ලබන්නේ කෙසේද;

(iii) එක් අයෙකුගේ දෛනික ආදායම රු.300/-ක් වනවිට පවුලේ දෙදෙනෙකු මසකට දින 30ක් වැඩ කළත් මාසික ආදායම රු.18,000/-ක් පමණක් බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනවලට අනුව දරුවන් දෙදෙනෙකු සිටින (දෙමව්පිය දෙදෙනා සමඟ 04 දෙනෙකුගෙන් යුත්) පවුලක මාසික අත්‍යවශ්‍ය වියදම රු.41,000/-කට වැඩි වනබව පිළිගන්නේද;

(ii) ඒ අනුව සමෘද්ධි ආධාර නවත්වා සවිබලගන්වන පවුලක ස්ථිර මාසික ආදායම රු.41,000/-ක මට්ටමක තිබිය යුතු වන්නේද;

(iii) එසේ නම්, සවිබලගැන්වූ පවුල් යනු රු.41,000/-කට වැඩි ස්ථිර මාසික ආදායමක් ඇති පවුල් වශයෙන් නිර්ණය කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1704/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් ආයතනයේ,

(i) ලිපිනය;

(ii) උපාධි ප්‍රදානය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලබාගෙන ඇති දිනය;

(iii) පිරිනමනු ලබන උපාධි;

(iv) ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව;

(v) එක් එක් උපාධි පාඨමාලාව සඳහා අයකරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1706/'17

ගරු විදුර වික්‍රමනායක මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව වශයෙන් ඇතැම් අඩු ආදායම්ලාභීන් විසින් මාසිකව රු.1900/-ක් ලබා ගත් බවත්;

(ii) වෙනත් ආදායම් මාර්ගයක් නොමැති සහ දරුවන්ගේ උදව් උපකාර නොමැති අඩු ආදායම්ලාභීන්ගේ එදිනෙදා අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා මෙම මුදල මහත් සේ උපකාරී වූ බවත්;

(iii) තමන්ගේ වයෝවෘද්ධභාවයට රජයෙන් ලබාදෙන කෘතවේදී දීමනාවක් වශයෙන් ඔවුන් මෙය අගය කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජීවන වියදම ඉහළ යමින් පවතින මෙම වකවානුවේදී ඇතැම් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට එම දීමනාව ලබාදීම නවතා ඇති බවත්;

(ii) එක් දරුවෙකු හෝ රජයේ සේවයේ යෙදී සිටින්නේ නම්, ඔහු හෝ ඇය විවාහවී වෙනත් ස්ථානයක පදිංචිවී සිටියත්, මෙම දීමනාව ඔවුන්ගේ පියාට හෝ මවට හෝ හිමිව තිබුනද, මැතකදී එවැනි පුද්ගලයන්ටද මෙම දීමනාව ගෙවීම නවතා ඇති බවත්;

(iii) තනිවම ජීවත්වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මෙම දීමනාව ලබාදීම නතර කිරීම බලවත් අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) උක්ත දීමනාව ගෙවීම නතර කර ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා එම දීමනාව නැවත ගෙවීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1724/'17

ගරු කනක හේරත් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2014 සිට 2016 දක්වා,

(i) ශ්‍රී ලංකාවේ පොල් වගාකර ඇති ඉඩම් ප්‍රමාණය;

(ii) කැබලි කිරීම සඳහා අනුමතිය ලබාදී ඇති පොල් ඉඩම් ප්‍රමාණය;

(iii) කැබලි කරන ලද පොල් ඉඩම් ප්‍රමාණය;

එක් එක් වර්ෂය සහ දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොල් ඉඩම් කැබලි කිරීමෙන් රටේ පොල් වගා බිම් ප්‍රමාණය අඩු වී දේශීය පරිභෝජනයට අවශ්‍ය පොල් හිඟයක් ඇති වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එයට පිළියමක් ලෙස අනුගමනය කිරීමට අපේක්ෂා කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1736/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ද්විතියික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිඋල්ල අධ්‍යාපන කලාපයට අයත්, කැකුණගොල්ල මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශය ඉවත් කරන ලද බවත්;

(ii) 2015 වර්ෂයේ සිට කැකුණගොල්ල, පුම්මා පල්ලියට අයත් ඉඩමේ තාවකාලික ගොඩනැගිල්ලක එම ප්‍රදේශයේ පළමු වසර සිසුන් සඳහා පන්ති පවත්වා ගෙන යන බවත්;

(iii) ප්‍රාථමික අංශයේ සමාන්තර පන්ති කිහිපයක 200කට ආසන්න ශිෂ්‍යයන් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන එම පාසලට ප්‍රමාණවත් ගුරුවරුන්, පංති කාමර පහසුකම්, ගෘහ භාණ්ඩ, ළමා උද්‍යානයක්, ආරක්ෂක වැටක් සහ වැසිකිළි පහසුකම් ඇතුළු මානව හා භෞතික සම්පත් කිසිවක් මේ දක්වා ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන්ගේ යහපත උදෙසා ඉහත සඳහන් අවශ්‍යතා සියල්ල නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1087/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුධ, ගුවන් සහ නාවික යන ත්‍රිවිධ හමුදාවන්හි අශ්වාරෝහක අංශය තුළ සිටින අශ්වයන් සංඛ්‍යාව;

(ii) එම අශ්වයන් නඩත්තු කිරීම සඳහා වැය කරන මුදල;

(iii) උක්ත අශ්වයන්ගෙන් ගනු ලබන ප්‍රයෝජන;

එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත හමුදාවන්ගේ අශ්වාරෝහක අංශයට තවත් අශ්වයන් ගෙන්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1205/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු, ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු, ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1376/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 130 ට අනුව, වැඩි අස්වනු ලබා දෙන බීජ හඳුන්වාදෙන සමාගම්වලට අර්ධ බදු විරාමයන් ලබා දුන්නේද;

(ii) එවැනි බදු සානුබලයක් ලබා ගත් සමාගම්වල නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත යෝජනාවට අනුව, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආනයන බදු ඉවත් කිරීමට යෝජනා කළ බැවින්,

(i) 2015 ජනවාරි 01 දින වනවිට, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

(ii) 2016 ජනවාරි 01 දිනෙන් පසු, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1469/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) දැනට ස්ථිර ග්‍රාම නිලධාරියෙකු සිටින ග්‍රාම සේවා වසම් හා එහි සේවයේ නියුතු ග්‍රාම නිලධාරින්ගේ නම් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1516/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත් කිරීමට සහ සංකල්පීය පත්‍රිකා සැකසීමට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ගෙවීම් කළ තැනැත්තන්ගේ නම් සහ එම එක් එක් පුද්ගලයාට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1619/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සීඝ්‍රයෙන් දියුණු වන ඇඹිලිපිටිය නගරය තුළ ව්‍යාපාරික ඉඩම් සඳහා හිමිකම් ලබාදීමේ ගැටලුවක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, නිවැරදි අයුරින් ඉඩම් හිමිකම් ලබාදීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නගරයේ ඉඩම් සම්බන්ධයෙන් විහාරස්ථානයක් අයිතිවාසිකම් ප්‍රකාශ කරන බැවින්, ව්‍යාපාරිකයන් තමන්ගේ ව්‍යාපාරික ස්ථාන තුළ ගොඩනැගිලි ඉදිකිරීම සිදු නොකරන බව දන්නේද;

(ii) මෙම විහාරස්ථානයට මෙකී ඉඩම් සම්බන්ධයෙන් සත්‍ය වශයෙන්ම ඇති හිමිකම කවරේද;

(iii) වසර ගණනාවක සිට මෙම නගරය තුළ අදාළ ව්‍යාපාරික ස්ථාන භුක්ති විඳිමින් සිටින ව්‍යාපාරිකයන්ට ඒවායේ හිමිකම් ලබාදීමටත්, තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ව්‍යාපාරික ප්‍රජාවට පහසුකම් සැපයීමටත් පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1680/'17

ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා,— සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපු දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය රෝහල් වන මාන්කර්නි, මහිලූර්, මාන්චෝලෙ, උන්නිච්චායි, කදිරවෙලි, මන්ඩූර් සහ මහිලවට්ටවන් යන රෝහල් වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් තාවකාලිකව වසා දමා ඇති බවත්;

(ii) අනෙකුත් පහසුකම් සහ නාම පුවරු ද සහිතව ගොඩනැගිලි පවතින බවත්;

(iii) වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් දුර්වල මට්ටමක පවතින, ඉතා දුරබැහැර ප්‍රදේශ කරා ගමන් කිරීමට සිදුවීමෙන් මෙම ප්‍රදේශවල රෝගීන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින බවත්;

(iv) ගම්වාසී දුගී රෝගීන්ට නොමිලේ වෛද්‍ය සේවා සැපයීමේ සංකල්පය මුදුන්පත්වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම රෝහල් යළි විවෘත කර අවම වශයෙන් වෛද්‍යවරුන් දෙදෙනෙකු හෝ ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) මෙම රෝහල් යළි විවෘත කර සේවා සපයන මට්ටමට ගෙන එනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1692/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියානු ජාතික ධීවර සහයෝගිතා සම්මේලනයේ සහය ඇතිව ශ්‍රී ලාංකික ධීවරයන් සඳහා නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) මෙම නිවාස යෝජනා ක්‍රමය දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන්නේද;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ යුද්ධය මෙන්ම ස්වභාවික විපත්වලින් විශාල වශයෙන් හානියට පත් උතුරු සහ නැගෙනහිර පළාත්වල ධීවරයන් සඳහා නිවාස ඉදිකර දෙන්නේද;

(iv) එසේ නම්, ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව, ප්‍රදේශ සහ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1700/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එරාවූර්, පුන්නකුඩා ග්‍රාමයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 370 ක් පමණ වන, ඉඩම බොහෝ කලක සිට පදිංචිකරුවෙකු හෝ නොමැති, කිසිදු සංවර්ධන කාර්යයකට හෝ ඉදිකිරීමක් සඳහා යොදා නොගත් ඉඩමක් ලෙස පවතින්නේද;

(ii) මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුදැනුම මත කර්මාන්ත කලාපයක් පිහිටුවීම සඳහා හඳුනාගෙන තිබේද;

(iii) ඒ අනුව, එම ඉඩම කර්මාන්ත කලාපයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නීත්‍යානුකූලව පවරා දීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කර තිබේද;

(iv) එම ඉඩමේ ආයෝජන කලාපයක් ඉදිකිරීමට අවශ්‍ය මූලික අධ්‍යයනය සිදු කිරීම සඳහා රුපියල් මිලියන 38ක වියදමකින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් ලංකා හයිඩ්‍රොලික් ආයතනයට පවරා තිබේද;

(v) මේ වනවිට එම භූමියේ තිබූ තල්ගස් කපා දමා, කිසියම් පිරිසක් අනවසරයෙන් වැටවල් ඉදිකර, ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භකර තිබේද;

(vi) අදාළ බලධාරීන් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1702/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ බව සඳහන් කරමින් පුරප්පාඩු 980ක් සඳහා බඳවාගෙන ඇති බවත්;

(ii) නමුත්, මේ වනතෙක් විභාගයට පෙනී සිටි සෙසු අපේක්ෂකයන්ට ප්‍රතිඵල ලේඛනය පවා යවා නොමැති බවත්; අන්තර්ජාලයෙන්ද ලබාගැනීමට ඉඩක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ පිළිබඳව සොයා බලා ඉතිරි ප්‍රතිඵල නිකුත් කිරීමට පියවර ගෙන, ඒ අනුව සුදුසුකම් ලබන්නන් පුරප්පාඩු අනුව බඳවා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1705/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සංගීත පීඨය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ව්‍යවහාරික සංගීත අධ්‍යයනාංශයේ විෂය නිර්දේශය සනාතන සභාව විසින් අනුමත කර තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) එම අධ්‍යයනාංශයේ සිටින ස්ථිර, තාවකාලික සහ ආධුනික කථිකාචාර්යවරු සංඛ්‍යාව කොපමණද;

(v) තාවකාලික/ආධුනික කථිකාචාර්යවරු හා උපදේශකවරු බඳවාගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1713/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004.12.26 දින ඇති වූ සුනාමි ව්පතට මුහුණ දුන් හම්බන්තොට නගර සභා නිවාස පාරේ අංක 3/19 දරන නිවසේ පදිංචිව සිටි ටී. එන්. අමීර් මහතා ඇතුළු 68 දෙනෙකුගේ ඉඩම් 2010.03.17 දින වෙරළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා පවරාගත් බවත්;

(ii) පවරා ගත් ඉඩම් සඳහා ඉහත සඳහන් පිරිසට මෙතෙක් වන්දි ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1749/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ගුවන් විදුලි නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් විදුලි නාලිකා පවත්වාගෙන යනු ලබන ආයතන කවරේද;

(iii) එම ගුවන් විදුලි නාලිකාවල හිමිකරුවන් සහ එම නාලිකා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ආරම්භකර විකාශනය පවත්වාගෙන නොයන ගුවන් විදුලි නාලිකා තිබේද,

(v) එසේ නම්, එම නාලිකා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් විදුලි නාලිකා නියාමනය කරනු ලබන ආයතනය කවරේද;

(ii) දැනට එම ගුවන් විදුලි නාලිකා නියාමනය විධිමත්ව සිදු නොවන බව පිළිගන්නේද;

(iii) සමාජ හානියන් සිදුවන අයුරින් යම් යම් ගුවන් විදුලි නාලිකා මඟින් සිදු කරනු ලබන ප්‍රචාරයන් විකාශනය කිරීම වැළැක්වීම සඳහා ගුවන් විදුලි නාලිකා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1773/'17

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.09.10 දිනැති අංක 1670/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථාව අනුව නිලධාරින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතියට පටහැනි ලෙස උසස්වීම් ලබාදී තිබේද;

(ii) පශ්චාත් උපාධි සුදුසුකම් නොමැති නිලධාරින්ට විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබාදීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඉල්ලීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම කාලවකවානුව කවරේද;

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාව එයට අනුමතිය ලබාදී තිබේද;

(v) එම සම්මුඛ පරීක්ෂණය සඳහා නිලධාරින් 82ක් කැඳවූයේද;

(vi) ඔවුන් අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කළ, කාලවකවානුවට ඇතුළත් නිලධාරින්ගේ නාමලේඛනයක් සහ එයට අයත් නොවන නිලධාරින්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(vii) මෙම නිලධාරින් විශේෂ ශ්‍රේණියට උසස් කර තිබේද;

(viii) එසේ නම්, එම උසස්වීම් ක්‍රියාත්මක වන දිනය කවරේද;

(ix) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට පටහැනි ලෙස උසස්වීම් ලබාදී තිබේ නම්, ඊට වගකිවයුතු නිලධාරින් කවුරුන්ද;

(x) මෙම නිලධාරින් සම්බන්ධව ගනු ලබන පියවර කවරේද;

(xi) උසස්වීම් නොලැබීමෙන් අගතියට පත් නිලධාරීන් වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1776/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.03.31 දිනට විදේශයන්හි සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකික පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, ඔවුන් සේවයේ යෙදී සිටින රට අනුව, රැකියා වර්ගීකරණය අනුව සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව;

(ii) එම පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් ජාතීන්ට අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

121/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය වනවිට ශ්‍රී ලංකාව තුළ ඇති සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් හෝටලය සතු කාමර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 හා 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂ දෙක තුළදී ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණ ඇති රටවල් දහය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සංචාරක ව්‍යාපාරය නගා සිටුවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) සංචාරක ව්‍යාපාරය පුළුල් කිරීමේදී මෙරට පරිසරයට හා සංස්කෘතියට සිදුවන හානි අවම කර ගැනීමට අදාළව සැලසුම් සහගත වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කුමක්ද;

(iv) නොඑසේ නම්, පරිසරය හා සංස්කෘතිය ආරක්ෂා කිරීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

465/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (8)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, තනතුරු සහ එම පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1019/'16

ගරු නාමල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2015 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලද රාජ්‍ය හා සංස්ථාපිත ආයතනවලට අයත් ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉදිකිරීම්වලින්, 2015 ජනවාරි මාසයෙන් පසුව ආරම්භ කරන ලද ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1216/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1378/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 132ට අනුව, පොලොන්නරුව, කිලිනොච්චිය, රත්නපුර (ඇඹිලිපිටිය) දිස්ත්‍රික්කයන්හි සුවිශාල ගබඩා තුනක් ඉදිකිරීමට සහ මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉදිවන ගබඩාවේ වැඩ නිම කිරීමට රුපියල් මිලියන 1000 ක් වෙන කළ බව පිළිගන්නේද;

(ii) මන්නාරම දිස්ත්‍රික්කයෙහි ඉදිකෙරෙන ගබඩාවෙහි මුල් පිරිවැය ඇස්තමේන්තුව සහ මේ දක්වා වූ එහි ප්‍රගති සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කිළිනොච්චිය, ඇඹිලිපිටිය හා පොලොන්නරුවෙහි නව ගබඩා සංකීර්ණ තුන ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

(iv) 2015 අයවැය යෝජනා අංක 132 වෙනුවෙන් වෙන් කළ රුපියල් මිලියන 1000 ක මුදල වැය කළ ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1621/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික සීනි පරිභෝජන අවශ්‍යතාවය කොපමණද;

(ii) වර්ෂ 2011 - 2014 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සීනි ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකාව තුළ ප්‍රධාන වශයෙන් සීනි නිපදවීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රදේශ කවරේද;

(iv) වර්ෂ 2011 - 2013 දක්වා එක් එක් කර්මාන්තශාලාවෙන් නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (i) හි සඳහන් සීනි ප්‍රමාණය මෙරට තුළ නිෂ්පාදනය කළ නොහැකිද;

(vi) පරිභෝජන අවශ්‍යතාවය සඳහා අවශ්‍ය සීනි ප්‍රමාණය ආනයනය නොකර දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1643/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු මේ දක්වා,

(i) මධ්‍යම රජය විසින් ඌව පළාත් සභාවට ලබා දුන් මුදල;

(ii) ඌව පළාත් සභාව විසින් පුනරාවර්තන වියදම් ලෙස වෙන් කළ මුදල් ප්‍රමාණය ලබා දුන් මුළු මුදලෙහි ප්‍රතිශතයක් ලෙස;

(iii) පුනරාවර්තන වියදම් යටතේ සිදු කර ඇති කටයුතු;

(iv) ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කළ මුදල් ප්‍රමාණය, ලබා දුන් මුළු මුදලෙහි ප්‍රතිශතයක් ලෙස;

(v) ප්‍රාග්ධන වියදම් යටතේ සිදු කර ඇති කටයුතු;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1708/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ Fly Past උත්සවය හේතුවෙන් රත්මලාන ගුවන් තොටුපලේ වැඩකටයුතුවලට බාධා සිදුවන බව පිළිගන්නේද;

(ii) එසේම කටුනායක ගුවන් තොටුපලේ නැගෙනහිර භාගයේ ගුවන් යානා ගමන් කිරීම්වලට බාධා සිදුවන බව දන්නේද;

(iii) මෙම උත්සවය හේතුවෙන් විදෙස් ගතවන සහ මෙරටට පැමිණෙන ගුවන් මගීන්ටද බොහෝ විට අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම උත්සවය සඳහා රජය විසින් වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගෙන ඇති ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1726/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය චිත්‍රපට සඳහා පැනවූ බද්දෙන් 2015 සහ 2016 වර්ෂවලදී උපයාගත් ආදායම වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය ටෙලිනාට්‍ය සඳහා පැනවූ බද්දෙන් 2015 සහ 2016 වර්ෂවලදී උපයාගත් ආදායම වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලාංකික අධ්‍යක්ෂවරයෙකු විසින් විදේශයකදී නිපදවා මෙරටට ගෙන්වනු ලබන චිත්‍රපටි හෝ ටෙලිනාට්‍ය සඳහාත් බදු අයකරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1727/'17

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ ශිෂ්‍යත්ව ලබන සිසුන් ඉගෙනුම ලබන අධ්‍යාපන ආයතන කවරේද;

(ii) ඇතැම් විශ්වවිද්‍යාලවල පළමු වසරට සිසුන් ඇතුළත් වූ පසු මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම මාස 3ක් ප්‍රමාද වන්නේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1750/’17

ගරු ලකී ජයවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවත්වාගෙන යනු ලබන රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රූපවාහිනී නාලිකාව පවත්වාගෙන යනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් රූපවාහිනී නාලිකාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ආරම්භ කර ඇති රූපවාහිනී නාලිකාවලින් දැනට විකාශනය පවත්වාගෙන නොයන නාලිකා තිබේද;

(ii) එසේ නම්, එම නාලිකා කවරේද;

(iii) රූපවාහිනී නාලිකා නියාමනය සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(iv) එම නියාමනය නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(v) ද්වේශ සහගතව හා උපහාසාත්මකව යම් යම් නාලිකා මඟින් සිදු කරන බරපතල සමාජ හානි වැළැක්වීම සඳහා රූපවාහිනී නාලිකා නියාමනය කිරීමට කඩිනමින් විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1774/’17

ගරු විජිත හේරත් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවතින “සව්සිරිපාය” ගොඩනැගිල්ලේ අයිතිය පිළිබඳ නෛතික තත්ත්වය කවරේද;

(ii) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට, “සව්සිරිපාය” ගොඩනැගිල්ලෙන් ඉවත්වීමට සිදුවී තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

(iv) “සව්සිරිපාය” ගොඩනැගිල්ල වෙනත් අමාත්‍යාංශයකට පැවරීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1777/’17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) “මැරයින් ඩ්‍රයිව්” (Marine Drive) මාර්ගය දෙහිවල සහ වැල්ලවත්ත අතර සීමාවෙන් අවසන් කිරීමට හේතුව කවරේද;

(ii) එම මාර්ගය මොරටුව දක්වා දීර්ඝ කිරීමේ සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, මාර්ගය දීර්ඝ කිරීමේදී ගල්කිස්ස, ශාන්ත තෝමස් විද්‍යාලයේ ක්‍රීඩාංගනයෙන් යම් කොටසක් පවරා ගැනීමක් සිදුවේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) එම පවරා ගැනීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1787/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ඒවා පිහිටා තිබූ ස්ථානයන් කවරේද;

(iii) එම පාසල් ආවරණය වන අධ්‍යාපන කලාප සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම එක් එක් පාසල, රජයේ පාසලක් බවට ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1797/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1996 වර්ෂයේදී පොලිස් උපසේවයට බඳවාගත් නිලධාරීන්, 2006 වර්ෂයේදී පසුගිය රජය මඟින් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කළ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ස්ථිර සේවයට අනුයුක්ත කළ නිලධාරීන්ට 1996 වර්ෂය සිට නියමිත පරිදි සේවා වරප්‍රසාද හිමිවන්නේද;

(iv) නොඑසේ නම්, එම නිලධාරීන් සේවයට බඳවාගත් දිනයත්, ස්ථිර සේවයට අනුයුක්ත කළ දිනයත් අතර වසර 10ක කාලය නොසලකා හැරීමෙන් එම නිලධාරීන්ට බලවත් අසාධාරණයක් වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නගර තුළ යාචකයන් විශාල ප්‍රමාණයක් සිටින බවත්;

(ii) ඔවුන්ගෙන් සමහරක් විවිධ සමාජ විරෝධී කටයුතුවලට සම්බන්ධ බවත්;

(iii) ඇතැමුන් යාචක වෙස්ගත් වංචාකාරයන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින යාචකයන් පිළිබඳව සංගණනයක් කර තිබේද; එසේ නම්, එම දිනය කවරේද;

(ii) එම සංගණනයට අනුව ශ්‍රී ලංකාව තුළ සිටින යාචකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව ගැහැණු, පිරිමි හා ළමුන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යාචකයන් පිළිබඳ සංගණනයක් කර නොමැති නම්, සංගණනයක් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) යාචකයන් පුනරුත්ථාපනයට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව තුළ ඇති යාචක පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුනරුත්ථාපන කටයුතු සඳහා වසරකට රජය වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1217/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1294/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නෛතික අයිතිය නොමැතිව මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල මේ දක්වා පදිංචිව සිටින හෝ වගා කරමින් සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පුද්ගලයන් සංඛ්‍යාවෙන් කවර සංඛ්‍යාවකට ඔප්පු හෝ බලපත්‍ර ලබා දීමට පියවර ගෙන තිබේද;

(iv) ඉහත (iii) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2014 හා 2015 වර්ෂයන්හි මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සඳහා පිරිනමා ඇති ඔප්පු හෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) ඉහත (v) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1385/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 145 යෝජනාවට අනුව, ධීවර ප්‍රජාවගේ සුරක්ෂිතභාවය අරමුණු කර ගනිමින්, මුහුදේදී සිදුවන අනතුරු සඳහා රුපියල් මිලියනයක ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රක්ෂණ ආවරණය ලබාදෙන ආයතනය සහ ඒ වෙනුවෙන් ගෙවනු ලබන රක්ෂණ වාරිකයන් කවරේද;

(iii) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් හානිපූරණය කළ ප්‍රමාණය කොපමණද;

(iv) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය අනුව, ජීවිත රක්ෂණ ආවරණය ලැබූ ධීවරයන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1470/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) මිහින් ලංකා සමාගම ආරම්භක අරමුණු කවරේද;

(iii) මිහින් ලංකා සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මිහින් ලංකා ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මිහින් ලංකා සමාගම ණය ලබාගත් හා ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) මිහින් ලංකා සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1623/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව පසුගිය වසර 10 තුළ ලබා ඇති ලාභය හෝ අලාභය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට මෙම කර්මාන්තශාලාවේ සේවයේ නියුතු ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර කිහිපය තුළ මෙම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තශාලාවෙන් මීට වඩා නිෂ්පාදනයක් ලබා කර ගැනීම සඳහා සුදුසුකම්ලත් නිසි කළමනාකාරිත්වයක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ වෙනුවෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1709/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තේ-පොහොර සහනාධාරය ලබා දී ඇති ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) දිවයිනෙහි සියළු කුඩා තේ වතු හිමියන්ට තේ-පොහොර සහනාධාරය ලබා දීම සඳහා අවශ්‍ය කරන මුදල ඇස්තමේන්තු කර තිබේද;

(iii) වර්ෂ 2015 සහ 2016 තුළ රජය විසින් තේ-පොහොර සහනාධාරය සඳහා වැයකර ඇති මුදල වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ තේ-පොහොර සහනාධාරය ලබාදී ඇති සහ මෙතෙක් ලබා දී නොමැති කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දිවයිනෙහි සිටින තේ-පොහොර සහනාධාරය ලැබීමට සුදුසුකම් ඇති කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් 2015 සහ 2016 වර්ෂවලදී පොහොර සහනාධාරය ලැබූ සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1725/’17

ගරු කනක හේරත් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2013 සිට 2016 දක්වා,

(i) මෙරටට ආනයනය කරන ලද තිරිඟු පිටි ප්‍රමාණය;

(ii) ඒ සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය;

(iii) ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය;

එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 සහ 2014 වර්ෂවලදී මෙරටට පිටි ආනයනය කිරීම අඩු කිරීම සඳහා පියවර ගත් බව දන්නේද;

(ii) මේ වනවිට තිරිඟු පිටි ආනයනය සීමා කිරීමට රජය විසින් පියවර ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1751/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා මේ වනවිට පවත්වාගෙන යනු ලබන සිනමාශාලා කවරේද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම සිනමාශාලාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි සිනමාශාලා වර්ගීකරණයක් කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයටද;

(iii) එම සිනමාශාලා නියාමනය කරනු ලබන්නේ කවුරුන්ද;

(iv) ඉතා අඩු පහසුකම් සහිතව හා දුර්වල ක්‍රියාකාරිත්වයෙන් යුතුව පවත්වාගෙන යනු ලබන සිනමාශාලා තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, සිනමාශාලා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා, සිනමාශාලා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1788/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ඒවා පිහිටා තිබූ ස්ථානයන් කවරේද;

(iii) එම පාසල් ආවරණය වන අධ්‍යාපන කලාප සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම එක් එක් පාසල, රජයේ පාසලක් බවට ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1798/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් වාර්ෂිකව සිදුවන අපරාධ ගණයට අයත් වන සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අපරාධ නඩුවලදී අධිකරණ ක්‍රියාමාර්ගවලින් වරදකරුවන් වන පුද්ගලයන්ගේ ප්‍රතිශතය කොපමණද;

(iii) එම අගය ආසියාවේ අනිකුත් රටවල් සමඟ සසඳන විට ඉහළ අගයක් ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1812/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතිය සවිකිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සිදුකරන සමාගම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ සමාගම් හා මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ආකාරය කවරේද;

(vi) එම සංඥා සවිකිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මිල ගණන් ඉදිරිපත්කර තිබුනේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1815/'17

ගරු බිමල් රත්නායක මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධශාසන අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් විහාරස්ථානවලට මුදල් ලබාදීමේ ක්‍රියාවලියක් පවතින බවත්;

(ii) එසේ මුදල් ලබාදීමේදී තෝරාගත් විහාරස්ථානවලට පමණක් මුදල් ලබාදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙලෙස විහාරස්ථානවලට මුදල් ලබාදීමේ ක්‍රියාවලියක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1865/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ලට අමතරව, පළාත් පාලන අයතන මඟින් බැහැර කර මේ වනවිට නිර්මාණය වී ඇති කසළ කඳු කවරේද;

(ii) ඒවා අයත්වන පළාත් පාලන ආයතන කවරේද;

(iii) වර්තමානයේ මෙම කසළ කඳුවල ඇති කසළ ප්‍රමාණය කොපමණද;

(iv) මේවා අතර දැනට අවදානම් තත්ත්වයේ පවතින කසළ කඳු තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි කසළ කඳුවලට තවදුරටත් කසළ බැහැර කරමින් ඒවා වර්ධනය වීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කිසියම් වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේද;

(iii) මේ සඳහා දේශීය හා විදේශීය වශයෙන් ආයෝජන ලබා ගැනීමේ වැඩසටහනක් තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) මේ වනවිට යම් වැඩසටහනක් ආරම්භ කර තිබේ නම්, එහි ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1869/'17

ගරු නාමල් රාජපක්ෂ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.02.26 වන දින ආරම්භ කරන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙහි (F.C.I.D) සේවයේ නියුතු මුළු කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එහි මාණ්ඩලික ශ්‍රේණියට අදාළ තනතුරු කවරේද;

(iii) එම තනතුරු සඳහා පත්කර ඇති නිලධාරීන්ගේ නම, ලිපිනය, දීමනා සහ අමතරව ගෙවන ලද විශේෂ දීමනා ඇතුළත් මුළු වැටුප වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.02.26 දින සිට මේ දක්වා පරීක්ෂණ කටයුතු සඳහා විදේශ සංචාරවලට සහභාගි කරවන ලද මුළු නිලධාරීන් සංඛ්‍යාව, ඔවුන් සංචාරය කරන ලද විදේශ රටවල් සංඛ්‍යාව, විදේශ රටවල් සහ එම සංචාර සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා සහභාගි වූ නිලධාරීන්ගේ නම, ලිපිනය, සංචාරය කළ විදේශ රට සහ එම සංචාර සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 ඔක්තෝබර් මස 04 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුපියල් කෝටි 400ක වැට් බදු මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට ලබා දුන් දඬුවම් එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ට නියම කරන ලද දඩ මුදල් ඔවුන් විසින් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත වැට් බදු වංචාවට සම්බන්ධ බොහෝ පිරිසක් සිටින බවත්;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් මෙම වංචාවට සම්බන්ධ බවත්;

(iii) ඇතැම් පිරිස් මේ වනවිට රටින් පැන ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වැට් බදු වංචාවට අදාළ සියලු පුද්ගලයන් පිළිබඳව විමර්ශන කටයුතු සිදුවන්නේද;

(ii) එසේ නම්, එමඟින් අනාවරණය කරගත් පුද්ගලයන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම් කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1219/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1386/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 144 යටතේ, ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අපනයන වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 150 ක් පමණ වන බව සඳහන් කර ඇති බැවින්, 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අපනයන ප්‍රමාණය හා අපනයන වටිනාකම දැක්වෙන ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) යුරෝපා වෙළඳපොළට මත්ස්‍ය අපනයන තහනම් කිරීමට තුඩු දුන් හේතු සාධක කවරේද;

(iii) තහනම ඉවත් කරවා ගැනීම සඳහා, එවකට ධීවර අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) යුරෝපා වෙළඳපොළට මත්ස්‍ය අපනයන තහනම ඉවත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒ අනුව මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1471/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නංවා ඇති ජලසම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ජලසම්පාදන ව්‍යාපෘතියේ නම, ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගැනීමට අපේක්ෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1624/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ආදායමට විශාල ශක්තියක් වන මැණික් කර්මාන්තය ප්‍රධාන වශයෙන් සිදු කරන රත්නපුර දිස්ත්‍රික්කයේ පාරම්පරික මැණික් පතල්කරුවන්ට අද එම කර්මාන්තය අහිමි වී යන බවත්,

(ii) මෙම කර්මාන්තය තුළ මහා පරිමාණයෙන් නියැලි ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් අතර සම්ප්‍රදායික පතල් කර්මාන්තකරුවා කුලිකරුවෙකු වී තිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට බැකෝ යන්ත්‍ර යොදාගෙන කැනීම් කිරීමට මහා පරිමාණ පතල් කර්මාන්තය සඳහා බලපත්‍ර නිකුත් කර තිබේද;

(ii) එසේ නම්, බලපත්‍රලාභීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) පාරම්පරික පතල් කර්මාන්තය සඳහා බැකෝ යන්ත්‍ර යොදා ගැනීමෙන් සාම්ප්‍රදායික පතල්කරුවාට අසාධාරණයක් මෙන්ම, විශාල පාරිසරික හානියක්ද සිදුවන බව පිළිගන්නේද;

(iv) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1710/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පොල් ගොවියාට එක් ගසකට රු. 52/- බැගින්, ගස් 8 සිට අක්කර 5 දක්වා "කප්රුක් පුරවර" නමින් සහනාධාරයක් ලබා දුන් බවත්; එම සහනාධාරය වර්තමානයේදී නොලැබෙන බවත් දන්නේද;

(ii) සහනාධාර නොලැබුණු පොල් වගාකරුවන්, එම සහනාධාරය ඉල්ලා 2016 වර්ෂයේ දෙසැම්බර් මස පොල් වගාකිරීමේ මණ්ඩලයේ රත්නපුර කාර්යාලයට ඉල්ලුම්පත් භාරදුන් නමුත්, මේ දක්වා එයට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් සොයා බලා වහාම පොල් ගොවියාට පෙර පරිදි එම සහනාධාරය ලබාදීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1754/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා ඇති ගඩලාදෙණිය, ලංකාතිලක සහ ඇම්බැක්ක යන සිද්ධස්ථාන ඉතා වැදගත් පෞරාණික ලෝක ප්‍රකට ස්ථාන බව පිළිගන්නේද;

(ii) මෙම ස්ථාන නැරඹීම සඳහා දිනපතා දේශීය හෝ විදේශීය සංචාරකයන් දහස් ගණනක් පැමිණෙන බව දන්නේද;

(iii) මෙම ස්ථානවල පොදු පහසුකම් නොමැති වීම හේතුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන් දැඩි අසීරුතාවයන්ට ලක්වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ස්ථානවල අඩුපාඩුව පවතින පොදු පහසුකම් කඩිනමින් ලබාදීම සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ කඩිනමින් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේනම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1799/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ගැටලු නිරවුල් කිරීමේ අරමුණින් "බිම්සවිය" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එය මේ වනවිට ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන්නේද;

(iii) නොඑසේ නම්, "බිම්සවිය" වැඩසටහන ක්‍රියාත්මකවන දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම "බිම්සවිය" වැඩසටහන කඩිනම් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් වී තිබේද;

(ii) එම වැඩසටහන කඩිනම් කිරීම සඳහා විදේශීය ආධාර ලබා ගන්නේද;

(iii) එසේ නම්, එය විදේශ ආධාරයක්ද; එසේ නැතහොත්, ණය මුදලක්ද;

(iv) එම ආධාරයේ මූල්‍යමය වටිනාකම කොපමණද;

(v) "බිම්සවිය" වැඩසටහන සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ඔක්තෝබර් මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1187/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්ධමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1330/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් (LTL) සමාගමෙහි උප සමාගමක් ලෙස LTL ප්‍රොජෙක්ට්ස් සමාගම පිහිටවූ දිනය කවරේද;

(ii) LTL සමාගමට එහි 100% ක අයිතිය තිබේද;

(iii) එහි වර්තමාන අයිතිකරුවන් කවුරුන්ද;

(iv) මේ වනවිට LTL සමාගමට LTL ප්‍රොජෙක්ට්ස් සමාගමේ කොටස් හිමිවී තිබේද;

(v) LTL සමාගම සතු LTL ප්‍රොජෙක්ට්ස් සමාගමෙහි කොටස් අන්සතු කිරීමට හෝ පැවරීමට අයිතියක් ලබා දුන්නේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) LTL සමාගමට අයත් සී/ස LTL ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) නමැති උප සමාගම 2006 න් පසු විගණන වාර්තාවන්ට ඇතුළත් වී නොමැති බවත්; ඒ හේතුවෙන් මෙම සමාගමේ ලාභාංශ රජයට නොලැබෙන බවත්;

(ii) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර 2006 වසරේ සිට මේ දක්වා රජයට අහිමි වූ ලාභාංශ මුදල් ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1404/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2016 අයවැය යෝජනා අංක 175ට අනුව, අලි - මිනිස් ගැටුමට ඉලක්කගත විසඳුමක් ලබාදීම සඳහා වර්ෂ 3ක් තුළ ප්‍රයෝජනයට ගැනීමට වෙන් කරන ලද රුපියල් මිලියන 4000ක ප්‍රතිපාදනයෙන් 2016 වර්ෂය තුළ උපයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය සහ එසේ වැය කළ මුදලෙහි ඵලදායීත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන අමාත්‍යාංශය හෝ ආයතන කවරේද;

(ii) 1977 සිට මේ දක්වා අලි - මිනිස් ගැටුමෙන් වාර්තා වූ මරණ සංඛ්‍යාව හා දේපළ හානිය එක් එක් වර්ෂය අනුව කවරේද;

(iii) ඉහත එක් එක් වර්ෂයේදී අලි - මිනිස් ගැටුමෙන් මියගිය පාර්ශ්වයන්ට රජය මඟින් වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම වන්දි මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කවරේද;

(v) උක්ත අයවැය යෝජනාවෙහි සඳහන් අලි-මිනිස් ගැටුම සඳහා ලබා දීමට අපේක්ෂිත ඉලක්කගත විසඳුම පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1473/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රට තුළ ක්‍රියාත්මක, රටේ සංවර්ධන කාර්යයට සුවිශේෂී දායකත්වයක් දක්වන ප්‍රාදේශීය මාධ්‍යවේදී සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රාදේශීය මාධ්‍යවේදී සංවිධානවල නම් හා එහි නිලතල දරන මාධ්‍යවේදීන්ගේ නම් කවරේද;

(iii) ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට මෙන්ම වෘත්තීය ජීවිතයේ අභිවෘද්ධිය උදෙසා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1497/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිනමාශාලා ඩිජිටල් කිරීමේ අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) එසේ නම්, සිනමාශාලා ඩිජිටල් කිරීමට රජය මැදිහත් නොවන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1499/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 23 වගන්තියට අනුව, වයස අවුරුදු 12 න් පහළ මුස්ලිම් දැරියන් විවාහ කර දීමේදී ක්වාසි විනිසුරුවරයන්ගේ අනුමතිය ලබා ගත යුතු බව දන්නේද;

(ii) ඒ අනුව, වයස අවුරුදු 12 න් පහළ මුස්ලිම් දැරියන් විවාහ කරදීමේදී, ක්වාසි විනිසුරුවරයන් විසින් අවසර ලබා දී තිබෙන බවට වාර්තා වී තිබේද;

(iii) එසේ නම්, වර්ෂ 2010 සිට මේ දක්වා එම පනත අනුව, අනුමතිය ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව සහ ඒ පිළිබඳ විස්තර එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1504/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේ මුල් භාගයේදී සහ 2017 වර්ෂයේ මේ වනවිට වෙළඳපොළේ වී වගාව සහ වෙනත් වැවිලි සඳහා භාවිතා කරනු ලබන විවිධ පොහොර වර්ගවල මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2016 වර්ෂය මුල පැවති පොහොර මිල අනුව සැසඳීමේදී, මේ වනවිට පොහොර මිල වැඩිවී ඇති බව පිළිගන්නේද;

(iii) 2016 වර්ෂය මුල වෙළඳපොළේ රු. 1300/- ක් වූ කිලෝ 50ක පොහොර මිටියක මිල මේ වනවිට රු. 2900/- දක්වා වැඩිවී තිබේද;

(iv) පොහොර මිල පාලනය නොකළහොත් හෝ පොහොර සහනය වෙළඳපොළ මිල ගණන් අනුව වැඩි නොකළහොත්, වැවිලි කර්මාන්තය ඇතුළුව කෘෂිකර්මාන්තය මත රඳාපුණු ජන ජීවිතය විශාල කඩා වැටීමකට ලක් වන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා යෝජනා කරන විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1508/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කවරේද;

(ii) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වී තිබේද;

(iii) 2016 වර්ෂය තුළදී ශුද්ධ විදේශීය මිලදී ගැනීම්වල අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1625/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට පාසල් පද්ධතිය තුළ ජනප්‍රිය පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමට උත්සාහ කිරීම මඟින් ග්‍රාමීය පාසල් විශාල ප්‍රමාණයක් වැසීයාමේ තර්ජනයට ලක්වී ඇති බව පිළිගන්නේද;

(ii) ළමුන් 50 ට අඩුවෙන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයේ, ගොඩකවෙල කොට්ඨාසය තුළ පිහිටි කෝම්පිටිය විද්‍යාලය දැනට වසා දමා ඇති බව දන්නේද;

(ii) මෙම පාසල වසා දැමීම, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ අදාළ ආයතන දැනුවත් කර නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, තම අභිමතය පරිදි පාසල වසා දමා එහි තිබූ භාණ්ඩ ද හිතුමතේ බෙදාදීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයා ඇතුළු කොට්ඨාස සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයන් වගකිව යුතු බව පිළිගන්නේද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1728/'17

ගරු බිමල් රත්නායක මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(ii) ඔවුන් පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(iii) වර්ෂ 2010 සිට 2017 දක්වා මෙම අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණයන් සහ මුදල් ලබාදුන් මූලාශ්‍රයන් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2010 සිට 2017 දක්වා මහපොළ භාරකාර අරමුදලේ පුනරාවර්තන වියදම් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) වර්ෂ 2005 සිට 2017 දක්වා මහපොළ භාරකාර අරමුදල මඟින් ශිෂ්‍යත්ව ගෙවීමට හා පුනරාවර්තන නොවන කාර්යයන් සඳහා කරන ලද ගෙවීම්, එක් එක් වර්ෂය සහ කාර්යය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1743/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද පත්වීම්ලාභීන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1744/'17

ගරු විජිත හේරත් මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 යන වර්ෂවලදී ලැබූ විදේශ ආයෝජන ප්‍රමාණය;

(ii) එකී වර්ෂවලදී නැවත ඉවත් කරගෙන ඇති, කලින් ලැබී තිබූ විදේශ ආයෝජන ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, එ මන්ද?

13.

1752/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය මැදිරි පෞද්ගලික ආයතනවලට ලබා දී තිබේද;

(ii) එසේ නම්, දුම්රිය මැදිරි ලබා දී ඇති කාලය, පදනම, ලබා දී ඇති ආයතන, සළකා බැලූ නිර්ණායක, එම මැදිරි සම්බන්ධ කළ දුම්රිය සහ මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොන්දේසි ප්‍රකාරව, දුම්රිය මැදිරි පවරා ඇති ආයතනවලින් දුම්රිය දෙපාර්තමේන්තුවට අයවිය යුතු සියලු මුදල් මේ වනවිට ලබාගෙන තිබේද;

(ii) හිඟ මුදල් අයවිය යුතු ආයතන කවරේද;

(iii) එක් එක් ආයතනයෙන් අයවිය යුතු හිඟ මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දුම්රිය මැදිරි ලබාදීමෙන් මේ වනවිට දුම්රිය දෙපාර්තමේන්තුවට අලාභයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, මුළු අලාභය කොපමණද;

(iii) එම අලාභය දුම්රිය දෙපාර්තමේන්තුවට කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1778/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම් දිස්ත්‍රික්කය තුළ අලුතින් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති පළාත් පාලන ආයතන ස්ථාපිත කිරීමේදී සලකා බලන කරුණු කවරේද;

(ii) එම පළාත් පාලන ආයතනවලට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරි වසම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1811/'17

ගරු කනක හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම ලබන පාසල් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) දෙමළ මාධ්‍ය පාසල්වල උගන්වනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට පාසල්වල පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උසස් පෙළ) සමත් පුද්ගලයන්ට පුහුණුවක් ලබා දී දෙමළ මාධ්‍ය ගුරුවරුන් ලෙස බඳවා ගැනීමට ක්‍රියා නොකරන්නේ මන්ද;

(ii) දැනට ශ්‍රී ලංකාවේ පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා විදෙස් රටවලින් ගුරුවරුන් ගෙන්වීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එමඟින් දෙමළ මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලැබූ පුරවැසියන්ට අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ඔක්තෝබර් මස 17 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1220/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1331/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට (LTL Holdings (Pvt.) Ltd) අයත් උප සමාගම් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම උප සමාගම් පිහිටුවීමේ ක්‍රමවේදය කවරේද;

(iii) එම එක් එක් සමාගමෙන් කෙරෙන කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත සමාගම්වල ආදායමෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ලැබෙන ලාභ කොටසේ ප්‍රතිශතය, එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ලාභ කොටස් නිවැරදි නොවන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1406/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 185ට අනුව, නිදහස් Wi-Fi පහසුකම් සැපයූ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ එම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් මෙම පහසුකම් භුක්ති විඳීම ආරම්භ කළ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉහත ඩිජිටල්කරණ පහසුකම් සැපයීම වෙනුවෙන් රජය විසින් දරනු ලැබූ මුළු පිරිවැය කොපමණද;

(iii) එම පිරිවැය, වැය බරක් වූ අමාත්‍යාංශය හෝ ආයතනය කවරේද;

(iv) රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉගෙනුම ලබන සියලුම සිසුන්ට ලැප්ටොප් පරිගණක ලබා දීම සම්බන්ධයෙන් රජයට නිශ්චිත වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1477/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(ii) 2015 වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මෙම එක් එක් ආයතනය සඳහා බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ බඳවා ගනු ලැබූ පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ බඳවා ගනු ලැබූ තනතුරු කවරේද;

(iv) එම සේවකයන් බඳවා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1729/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය හා විදේශීය අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලාංකිකයන්ට ජනාධිපති අරමුදල මඟින් පූර්ණ හෝ අර්ධ ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ අනුව ඒ සඳහා සුදුස්සන් තෝරා ගනු ලබන පදනම හා ක්‍රමවේදය කවරේද;

(iii) අ.පො.ස. (උසස් පෙළ) ඉහළම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(iv) පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා උපාධිධාරින්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(v) ඉහත (iii) සහ (iv) හැර වෙනත් දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(vii) වර්ෂ 2005 සිට 2017 දක්වා ඉහත (iii) සහ (iv) හි සඳහන් ක්‍රමවේදවලට පරිබාහිරව, දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව ලබාගත් පුද්ගලයන්ගේ නම්, මුදල, ආයතන හා විදේශ රටක් නම්, එම රටෙහි නම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1730/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය මඟින් යෝජනා කළ පරිදි තම ජීවිතයේ සැඳෑ සමය ගෙවන කලාකරුවන් වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා දායක වී ඇති කලාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2016 හා 2017 වර්ෂවලදී රජය මඟින් මේ සඳහා වෙන් කළ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1735/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය සඳහා යන ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් වෙනුවෙන් වසරකට වැයවෙන මුදල සඳහා ලංකාවේ විදේශ මුදල් සංචිතයට දැරීමට සිදුවන බර කොපමණද;

(ii) පෞද්ගලික විදේශ සංචාරයන් සඳහා විදේශගතවන පුද්ගලයන් වෙනුවෙන් ලංකාවේ මුදල් සංචිතයට වසරකට දැරීමට සිදු වන බර කොපමණද;

(iii) ලංකාවෙන් යැවෙන වෙළඳ භාණ්ඩ හෝ සේවාවන් වෙනුවෙන් ලංකාවට අයවිය යුතු විදේශ මුදලින් කොපමණ මුදලක් නොලැබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1753/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දිවයින පුරා ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සතු පිරවුම්හල් සංඛ්‍යාව සහ පෞද්ගලික ආයතනයන් සතු පිරවුම්හල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) ඉහත (iii) හි සඳහන් පිරවුම්හල් දැනට පවත්වාගෙන යනු ලබන පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ආයතන සතු ඉන්ධන පිරවුම්හල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) ඒවා අයත් පුද්ගලයන් කවුරුන්ද;

(iii) ඉන්ධන පිරවුම්හල් නියාමනය කිරීම නියමානුකූලව සිදු නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම ඉන්ධන පිරවුම්හල් නියාමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(v) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1779/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල නම් කවරේද;

(iii) 2010 වර්ෂය සිට මෙම එක් එක් පෙර පාසල සඳහා ලබාදුන් ආධාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iv) දිස්ත්‍රික්කයේ පෙර පාසල් දියුණු කිරීමට සහ නියාමනය කිරීමට පළාත් සභාව ගෙන ඇති හා ඉදිරියට ගැනීමට අපේක්ෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1789/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ඒවා පිහිටා තිබූ ස්ථානයන් කවරේද;

(iii) එම පාසල් ආවරණය වන අධ්‍යාපන කලාප සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම එක් එක් පාසල, රජයේ පාසලක් බවට ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක හා දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1852/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක වන බව පිළිගන්නේද;

(ii) නවක ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමට විභාග දෙපාර්තමේන්තුව මඟින් තරග විභාගයක් පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට ආසන්නව තිබියදී, විශ්‍රාම ගොස් සිටින ග්‍රාම නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට කටයුතු කරමින් සිටින්නේද;

(iii) එසේ නම්, එමඟින් තරග විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ට බලවත් අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නව බඳවා ගැනීම් කොන්ත්‍රාත් පදනමින් සිදුකරන්නේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1854/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වසරේ සිට ඉදිරි වසර 03 ක් දක්වා කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1873/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ, I, II සහ III වැනි ශ්‍රේණි සඳහා අනුමත සේවක සංඛ්‍යාව (Cadre) සහ මේ වනවිට සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ,

(i) විශේෂ ශ්‍රේණියට අයත් තනතුරු කවරේද;

(ii) මේ වනවිට එම තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ සේවාවන් කවරේද;

(iii) I වැනි ශ්‍රේණියට අයත් තනතුරු කවරේද;

(iv) මේ වනවිට එම තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ සේවාවන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1949/'17

ගරු මයන්ත දිසානායක මහතා,— ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උඩරට ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පසුගිය රජය විසින් අහෝසි කිරීම හේතුවෙන් උඩරට ප්‍රදේශයේ ජනතාවට අසාධාරණයක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උඩරට සංවර්ධන අධිකාරියෙන් උඩරට ප්‍රදේශයට හිමි වූ සංවර්ධන ප්‍රතිලාභ කවරේද;

(ii) එම අධිකාරියට වෙන් කළ මුදල කොපමණද;

(iii) එම අධිකාරියෙන් සිදු කළ කාර්යයන් සහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති කවරේද;

(iv) උඩරට සංවර්ධන අධිකාරියේ සභාපතිත්වය සහ ආයතනික වගකීම් දරන ලද පුද්ගලයන් කවුරුන්ද;

(v) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් උඩරට ප්‍රදේශයේ දිළිඳු ගම්මානවල ජනතාවට ලබාදුන් රැකියා සහ රැකියා සංඛ්‍යාව කවරේද;

(vi) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් දිළිඳු ගම්මානවල ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව හා ව්‍යාපෘතිවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව නැවත ආරම්භ කිරීමට අදහස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1951/'17

ගරු කනක හේරත් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014, 2015 සහ 2016 වර්ෂවල ශ්‍රී ලංකාවේ කුඩා රබර් කර්මාන්තයෙන් යැපුණු පවුල් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2016 වර්ෂයේදී එම පවුල් සංඛ්‍යාව, 2014 වර්ෂයට වඩා කොපමණ ප්‍රමාණයකින් අඩු වී තිබේද;

(iii) රබර් වගා නොකිරීමෙන් රැකියාව අහිමි වූ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නංවාලීමට රජය ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) අතහැර දැමූ රබර් වගාව නැවත නඟා සිටුවීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ඔක්තෝබර් මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1221/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1332/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් නමින් ආයතනයක් තිබුණේද;

(ii) එම ආයතනයේ නම වෙනස් කර තිබේද;

(iii) එසේ නම්, එහි වර්තමාන නම කවරේද;

(iv) සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් කොටස් බෙදී ගොස් ඇත්තේ කෙසේද;

(v) ESOT (භාරය) කොටස්කරුවන් සතුව ඇති කොටස් පාලනය කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එහි කොටස්කරුවන්ගේ නම් හා ඔවුන් සතුව ඇති කොටස් සංඛ්‍යාව පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(vii) සේවකහාර ගිවිසුම් අනුව, එය පිහිටුවා කොපමණ කාලයක් ඇතුළත ඔවුන්ගේ කොටස් පිළිබඳව හා ඔවුන් කොටස්කරුවන් බව දන්වා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ESOT සමාගමෙහි ආරම්භක කොටස්කරුවන් කවුරුන්ද, ඔවුන් සතුව තිබූ කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම කොටස්කරුවන් අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන්ට ලබාදියාව පිළිබඳව පිළිගැටුම තිබෙන බව එතුමා පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) COPE වාර්තාවේ සඳහන් පරිදි සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමෙන් රුපියල් දස ලක්ෂ 232 ක ලාභාංශ ප්‍රමාණයක් ලංකා විදුලිබල මණ්ඩලයට නොගෙවා තිබෙන බව දන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1408/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 182 යෝජනාවට අනුව, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් (Primary Industry Council) පිහිටුවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය සහ ස්ථානය කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාවෙහි, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් පිහිටුවීමේ අරමුණු හා ඒ සඳහා වූ වැඩපිළිවෙළ සැකෙවින් පැහැදිලි කරන්නේද;

(iv) මෙම කවුන්සිලයට සම්බන්ධවන විශේෂඥයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) උක්ත යෝජනාවෙහි සඳහන් වන ශ්‍රී ලංකාවේ දැනට සක්‍රීයව පවත්නා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(vi) 2009 යුද ගැටුම් නිමවීමෙන් පසු, උතුරු නැගෙනහිර ඇතුළුව ශ්‍රී ලංකාව තුළ අළුතින් ඇරඹූ ප්‍රාථමික කර්මාන්තයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1542/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරවෙල ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල නිරත වන බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය මරු පහරක් වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් වගා හානි වූ ජනතාවට වන්දි ගෙවීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1583/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, රුවන්පුර සුනාමි නිවාස සංකීර්ණයේ, මයුරපුර, රුවන්පුර, අංක 35 දරන නිවස එස්. එම්. සිජාවුදීන් මහතාට ලබාදුන්නේද;

(ii) එසේ නම් , එම දිනය කවරේද;

(iii) ඔහු, එම නිවසේ කොපමණ කාලයක් පදිංචිව සිටියේද;

(iv) මේ වනවිට එම නිවසේ පදිංචිව සිටින්නේ කවුරුන්ද;

(v) ඉහත පුද්ගලයාගෙන් එම නිවස බලහත්කාරයෙන් පැහැරගෙන ඇති බව දන්නේද;

(vi) 2010 දෙසැම්බර් මාසයේදී, මේ සම්බන්ධයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්වරයාට ඉදිරිපත් කළ පැමිණිල්ල සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1745/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පරකඩුව, කුඩා තේ වතු සංවර්ධන සමිතියේ, තේ ශක්ති සාමාජික අංක 109131 දරන කේ. පී. සිරිසේන යන අය 2016 වර්ෂයේදී හදිසියේ මිය ගොස් ඇති බවත්;

(ii) ඔහුට හිමිවිය යුතු තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලුම ලියකියවිලි මරණකරුගේ බිරිඳ වූ පී. එම්. ලුසිඩා මහත්මිය (පසු හිමිකරු) විසින් 2016.09.30 දින රත්නපුර කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රාදේශීය සංවිධානය වෙත භාරදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලියකියවිලි භාරදී දැනට මාස 06කට ආසන්න කාලයක් ගතවී ඇතත්, මේ දක්වා එම ප්‍රතිලාභ මුදල ලැබී නොමැති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එකී ප්‍රතිලාභ මුදල හැකි ඉක්මනින් ඇයට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1755/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොඩ ඉඩම් නොමැති පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක කොටසක් ගොඩකර නිවසක් ඉදිකර ගැනීමට අවසර ලබාදීම දීර්ඝ කාලයක සිට පැවති බව දන්නේද;

(ii) දැනට ගොඩ ඉඩම් අහිමි පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10 ක පමණ කොටසක් ගොඩකර නිවසක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අවස්ථා අහිමි කර ඇති බව පිළිගන්නේද;

(iii) එමනිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල ඉඩම් නොමැති විශාල පිරිසක් අසරණ තත්ත්වයකට පත්ව සිටින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් ගොඩකර ගැනීම සඳහා මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුද්ගලයන්ට ඉතා කඩිනමින් එම පර්චස් 10ක කුඹුරු ඉඩම් ගොඩකර ගැනීමට අවස්ථා සලසා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1780/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන, පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි රෝහල්, මධ්‍යම බෙහෙත්ශාලා සහ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ස්ථානවල නම් කවරේද;

(iii) ඉහත එක් එක් සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවක පුරප්පාඩු පවතීද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) එම සෞඛ්‍ය මධ්‍යස්ථාන දියුණු කිරීමට සහ සේවක පුරප්පාඩු පිරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1790/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ඒවා පිහිටා තිබූ ස්ථානයන් කවරේද;

(iii) එම පාසල් ආවරණය වන අධ්‍යාපන කලාප සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම එක් එක් පාසල, රජයේ පාසලක් බවට ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1853/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙගාපොලිස් සැලසුම යටතේ 2017 වසරේ සිට ඉදිරි වසර 03 ක් දක්වා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තුවන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1870/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.01.01 දින සිට 2017.04.30 දින දක්වා ජනාධිපතිවරයා විසින් සිදුකර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල නම් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනාධිපතිවරයා සමඟ එක් එක් සංචාරය සඳහා සහභාගී වූ අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ නිලධාරීන් ඇතුළු සමස්ථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ජනාධිපතිවරයා සමඟ සංචාරවලට සහභාගි වූ සෙසු පුද්ගලයන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1952/'17

ගරු කනක හේරත් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ,

(i) රජය සතු ඉඩම් ප්‍රමාණය;

(ii) පදිංචිය සඳහා බෙදා දීමට හඳුනාගෙන ඇති රජය සතු ඉඩම් ප්‍රමාණය;

(iii) පදිංචිය සඳහා ඉඩම් ඉල්ලුම් කර ඇති පවුල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉල්ලුම් කර ඇති පවුල් සඳහා හඳුනාගෙන ඇති රජය සතු ඉඩම් ලබාදීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1958/'17

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2017 මැයි මස 26 දින සිට ජූනි මස 05 දින දක්වා ඇතිවූ ගංවතුර හා නායයාම් හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ;

(i) මරණයට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) හානි වූ නිවාස සංඛ්‍යාව;

(iii) නායයාම හේතුවෙන් පමණක් හානි වූ නිවාස සංඛ්‍යාව;

(iv) ගංවතුර හේතුවෙන් සම්පූර්ණයෙන් හා අර්ධ වශයෙන් හානියට පත්වූ නිවාස සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1961/'17

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 මැයි මස රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුර හා නායයෑම් හේතුවෙන් පූර්ණ හානි වූ නිවාස 630ක් හා අර්ධ හානි වූ නිවාස 4608ක් වාර්තා වී ඇති බව දන්නේද;

(ii) හානියට පත් නිවාස නැවත ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) මේ සඳහා වතු සමාගම් සතු ඉඩම් පවරාගන්නේද;

(iv) මෙම ඉඩම් කඩිනමින් පවරා ගැනීමට දැනට පවතින නීතිරීති සංශෝධනය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හානියට පත් නිවාස සඳහා වන්දි මුදලක් ලබාදීමට රජය නියමිත කාලසීමාවක් තීරණය කර තිබේද;

(ii) ආපදාවට ලක්වූ සියලු නිවාස සඳහා වන්දි මුදල් ලබාදෙන්නේද;

(iii) නිවාස හානි සඳහා වන්දි මුදල් ලබාදීමේදී සලකා බලනු ලබන නිර්ණායකයන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1962/'17

ගරු මොහොමඩ් නවවි මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ සිට මේ වනතෙක් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රතිපාදන ලැබුනු ආකාරය කවරේද;

(iii) එම ප්‍රතිපාදන යොදා ගනිමින් මේ වනවිට නිම කර ඇති හා සිදු කෙරෙමින් පවතින වැඩසටහන්/ව්‍යාපෘති තිබේද;

(iv) මෙම කාලසීමාව තුළ කිසියම් ආයතන හෝ සංවිධාන සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු කර ඇත්නම්, එකී මුදල හා ප්‍රතිලාභී ආයතනයේ හෝ සංවිධානයේ නම් හා ලිපිනයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) උක්ත කාලසීමාව තුළ අවිච්ඡේද වූ මුදලක් ඇත්නම්, එම මුදල් ප්‍රමාණයත්, එසේ වූ ආකාරයත් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1222/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1334/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ග නොකළ කසළ එකතු නොකිරීමට පළාත් පාලන ආයතන ගත් තීරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) කසළ වර්ගීකරණය කර එකතු කිරීමට අවශ්‍ය පහසුකම් ජනතාවට ලබාදී තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(v) වර්ගීකරණය කරන ලද කසළ එකතු කිරීමට පළාත් පාලන ආයතන සඳහා පහසුකම් සලසා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කසළ වර්ගීකරණය කර නොදෙන පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) වර්ගීකරණය කරන ලද කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ස්ථානයකදීද;

(iv) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල කොපමණද;

(v) ප්‍රතිචක්‍රීකරණය කරන ලද කසළ කවර කටයුතු සඳහා භාවිත කළ හැකිද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1409/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 181ට අනුව, රත්‍රන් ආනයනය සඳහා බලපත්‍ර 50ක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් විසින් ගෙවූ බලපත්‍ර ගාස්තු පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා ලෝක වෙළඳපොළෙහි රත්‍රන් මිල හැසිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) බදු රහිතව ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කරනු ලබන තැනැත්තන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කරනු ලබන ප්‍රධාන සැපයුම්කරුවන් සහ රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1474/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සංවර්ධන ව්‍යාපෘතියේ නම, වැය කරන ලද මුදල, කොන්ත්‍රාත් ලබාදුන් සමාගමේ නම, එම සමාගමට ලබාදුන් මුදල, විවෘත කළ දිනය සහ එම විවෘත කිරීම සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1746/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලයක් පවත්වාගෙන යාමට ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක වන්නේද, නොඑසේ නම්, ඒ මන්ද;

(ii) සිදුවිය හැකි අයවැය කප්පාදු කිරීම් පිළිබඳව විමසා බැලිය හැකි ආයතනය කවරේද;

(iii) අයවැයෙන් දෙනු ලැබූ පොරොන්දුවල ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය පාර්ලිමේන්තුව දැනගන්නේ කෙසේද;

(iv) 2017 අයවැයේ සුභසාධන යෝජනා ඉටුකිරීමේ දින සටහනක් (කැලැන්ඩරයක්) ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 අයවැය යෝජනාවලින් ඉටු නොකරන ලද යෝජනා කවරේද;

(ii) එම යෝජනා ඉටු නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1756/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේදී වල් ඌරන්ගෙන් මිනිස් ජීවිතවලට හානි සිදුවෙමින් පවතින බවත්;

(ii) මේ වනවිට වනඅලියා, කිඹුලා, වලහා, දිවියා හා කුළු හරකා යන සතුන්ගෙන් සිදුවන ජීවිත හානියකදී ස්ත්‍රී, පුරුෂ සමාජභාවය සහ වයස් භේදයකින් තොරව රු.200,000/-ක වන්දි මුදලක් ලබාදීමට කටයුතු සලසා ඇති බවත්;

(iii) නමුත්, වල් ඌරාගෙන් සිදුවන ජීවිත හානියකදී එවන් වන්දි ලබාදීමේ ක්‍රමවේදයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එවන් හානිවලට ලක් වූ ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන අය වෙනුවෙන් වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා කඩිනමින් වන්දි ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1791/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ඒවා පිහිටා තිබූ ස්ථානයන් කවරේද;

(iii) එම පාසල් ආවරණය වන අධ්‍යාපන කලාප සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම එක් එක් පාසල, රජයේ පාසලක් බවට ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1813/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වලින් බදු දී ඇති ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්, බදුගත් ආයතනය, බදුගත් දිනය, බදු කාලය සහ බදු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඉඩම් සඳහා හිඟ බදු ගෙවීමට ඇති ආයතන කවරේද;

(v) එක් එක් ආයතනයෙන් ගෙවීමට ඇති හිඟ බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1855/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වසරේ සිට ඉදිරි වසර 03 ක් දක්වා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1871/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට 2017.04.30 දින දක්වා ගරු අග්‍රාමාත්‍යවරයා විසින් සිදු කර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අග්‍රාමාත්‍යවරයා සමඟ එක් එක් සංචාරය සඳහා සහභාගි වූ අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ නිලධාරින් ඇතුළුව සමස්ත සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අග්‍රාමාත්‍යවරයා සමඟ විදේශ සංචාරවලට සහභාගී වූ සෙසු පුද්ගලයන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1875/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, දැඩි පානීය ජල හිඟයක් පවතින ගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්වල නම් කවරේද;

(iii) ජල හිඟයෙන් පීඩා විඳින ගම් සඳහා ජල බවුසර් ලබාදීමේ වැඩසටහනක් ඔබ අමාත්‍යාංශය මඟින් ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, මේ දක්වා ලබාදී ඇති ජල බවුසර් සංඛ්‍යාව හා ඒවා ලබාදුන් ගම් කවරේද;

(v) ජල හිඟයෙන් පීඩා විඳින අනෙකුත් ගම් සඳහා ජල බවුසර් ලබාදීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1959/'17

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 මැයි මස 26 දින සිට ජූනි මස 05 දින දක්වා ඇතිවූ ගංවතුර හා නායයාම් අවදානම හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින, තම නිවාසවලින් ඉවත්වීමට උපදෙස් දී ඇති පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ නිවාස හිමියන්ට ඒ වෙනුවෙන් ඉඩම් ලබාදීමට සහ නිවාස ඉදිකර ගැනීමට වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iii) එසේ නම්, එක් පුද්ගලයෙකුට ලබාදෙන ඉඩම් ප්‍රමාණය සහ නිවසක් ඉදිකිරීමට ලබාදෙන වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1963/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේ සිට, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව වැලිඔය අධ්‍යාපන කලාපයේ ගුරු සහායකයන් ලෙස 29 දෙනෙකු සේවය කරන බවත්;

(ii) යුද ගැටුම් පැවති කාලයේ පටන් ඔවුන් දැඩි දුෂ්කරතා මධ්‍යයේ රාජකාරි කටයුතුවල නිරත වුවද, මේ වනතෙක් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර නොමැති බවත්;

(iii) එම පළාතේ සේවය කළ ස්වේච්ඡා ගුරුවරුන් කැබිනට් අනුමතියකින් ස්ථිර කිරීමට පියවර ගෙන ඇති බවත්;

(iv) එම අනුමතිය මත උතුරු පළාත් සභාව විසින් කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කළ ගුරුවරුන්ද ස්ථිර කිරීමට පියවර ගෙන තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගුරු සහයකයන්ගේ රැකියා සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1977/'17

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තිරියායහි පිහිටි ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් ගිරිහඩුසෑය බෞද්ධ විහාරස්ථානය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ගිරිහඬු සෑය විහාර භූමියේ ඇති තපස්සු භල්ලුක දෙබෑයන් පිළිබඳ සඳහන් වන ඓතිහාසික සෙල්ලිපිය කිසිදු ආවරණයක් නොමැතිව වැස්සට සහ අව්වට නිරාවරණය වෙමින් පවතින බව දන්නේද;

(iii) එම සෙල්ලිපිය තවදුරටත් විනාශවීම වළක්වා ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

(iv) ගිරිහඬු සෑය පූජා භූමිය විධිමත් පූජා නගරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1983/'17

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය සභාවට අයත් අළුත්ගම මහජන ක්‍රීඩාංගණය එම සභාව මඟින් නඩත්තු කරන බවත්;

(ii) මීට වසරකට පෙර එම ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කර සංවර්ධනය කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය සහ වර්ෂය කවරේද;

(ii) ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(v) ව්‍යාපෘතිය සඳහා අනුමත වූ සම්පූර්ණ මුදලම එම ව්‍යාපෘතියට යොදවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ක්‍රීඩාංගණය, උත්සවයක්/ක්‍රීඩා තරඟයක්/සාමාජීය කටයුත්තක් සඳහා වෙන් කර ගැනීමේදී බේරුවල ප්‍රාදේශීය සභාවෙන් අවසර ගැනීම සඳහා එම ප්‍රදේශය නියෝජනය කරන අමාත්‍යවරයාගේ නිර්දේශය අවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ප්‍රදේශයේ ක්‍රීඩා සමාජවලට මෙම ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කිරීම තහනම් කර තිබේද;

(iv) එසේ නම්, එයට පදනම් වූ හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිළිබඳව කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාව තුළ වැඩිවෙමින් පවතින අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම මෙරට ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත්වී ඇති හෙයින්ද,

ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුකර ප්‍රතිකර්ම යෙදීමේ වගකීම මෙම පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින්ද,

පහත සඳහන් කාරණා පිළිබඳව කරුණු විමර්ශනයකර සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) පසුගිය වකවානුවේ සිදුවූ අපරාධවල ස්වභාවය, එසේ අපරාධ සිදුවීම සඳහා බලපා ඇති කරුණු කාරණා, අපරාධ සිදුවීම අවම කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සහ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සහ/හෝ සංශෝධනයන්;

(ආ) සිවිල් සහ අපරාධ නඩුවලදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිණිස අනුගමනය කළ යුතු නිසි ක්‍රියා පිළිවෙත් සහ අලුතෙන් පැනවීමට අවශ්‍ය සහ/හෝ සංශෝධනයන්ට ලක්විය යුතු නීති රීති; සහ

(ඇ) ඉහත කරුණුවලට ආනුෂංගික වන්නා වූ සහ අවස්ථානුකූලව, සුදුසුයැයි හා අවශ්‍යයැයි කාරක සභාවට හැඟෙන සහ කාරක සභාව විසින් සලකා බලනු ලබන කරුණට බලපාන වෙනත් කාරණා;

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු ය;

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරුම / ප්‍රතිඥා කරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සහය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස (06) හයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 166/'15

2.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු මනුෂ නානායක්කාර මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු දිළුම් අමුණුගම මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු එස්.සී. මුතුකුමාරණ මහතා
ගරු විමලවීර දිසානායක මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු ලොහාන් රත්වත්තේ මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු කනක හේරත් මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන හෙයින්ද;

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි ප්‍රධානතම උපකරණය වන්නේ වාර්ෂික අයවැය ලේඛනය වන හෙයින්ද;

විසර්ජන පනත වශයෙන් මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය හා සම්බන්ධිත මූල්‍ය අගයන් ඉතා සවිස්තරාත්මකව, විනිවිද පෙනෙන අයුරින්, උපරිම විශ්වාසය රැකෙන පරිදි, සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානතම යුතුකම හා වගකීම වන හෙයින්ද;

මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක මහතා පාර්ලිමේන්තුව හා මහජනතාව නොමඟ යවන දුර්නිරූපණය සහිත අයවැය ලේඛනයක් මෙවර (2016) මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින්ද;

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණය (වගකීම්) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාවට 2015 අප්‍රේල් 20 වැනි දින පිළිගන්වන ලද 2014 වාර්ෂික වාර්තාවේ 85 වැනි පිටුවේ "සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් සඳහා සමස්ත ආයෝජනය රුපියල් බිලියන 164ක් වන අතර, 2013 වර්ෂයේදී සිදුකළ රුපියල් බිලියන 157ට වඩා රුපියල් බිලියන 7ක වැඩි වීමක්" වන හෙයින්ද;

"සාමාන්‍ය අධ්‍යාපනය සඳහා 2014 වර්ෂයේ සිදුකළ රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 117ක් වන අතර, එය 2013 වසරේ සිදුකළ බිලියන 108ක ආයෝජනයට වඩා 8%ක වැඩිවීමක්" වන හෙයින්ද;

2016 අයවැය ඇස්තමේන්තුවෙහි II වෙළුම 218 සහ 219 පිටු අනුව, 2015 වසරේදී සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රාග්ධන වියදම බිලියන 17.8 සිට 2016 දී රුපියල් බිලියන 18.3 දක්වාත් රුපියල් බිලියන 0.5කින් පමණ ඉතා සුළු ප්‍රමාණයකින් වර්ධනය වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ අයවැය ලේඛන ඉතිහාසයේ අසාමාන්‍ය හා විස්මිත වෙනසක් ඇති කරමින් 2016 වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වන පුනරාවර්තන වියදම 278%කින් (2015ට සාපේක්ෂව රුපියල් බිලියන 44 සිට බිලියන 167 දක්වා රුපියල් බිලියන 123කින්) රොකට් වේගයෙන් අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති හෙයින්ද;

මෙලෙස අසාමාන්‍ය හා විස්මයජනක ලෙස පුනරාවර්තන වියදම ඉහළ යෑමට බලපෑ ප්‍රධානතම හේතුව නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ කිසිම අයවැය ලේඛනයක සඳහන් නොවූ "රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යෑමේ පිරිවැය - ඉඩම් හා ගොඩනැගිලි" වශයෙන් රුපියල් මිලියන 121,352 හෙවත් රුපියල් බිලියන 121ක ගිණුම් සටහනක් පැවතීම වන හෙයින්ද;

මෙය පුනරාවර්තන වියදමක් ලෙස දැක්වුවද 2016 වර්ෂයේ දී සත්‍ය වශයෙන් වියදම් කරනු ලබන මුදලක් නොවන හෙයින්ද;

2016 වර්ෂයේදී අධ්‍යාපනයට වියදම් නොකරන රුපියල් කෝටි 1210කට අධික මුදලක් පුනරාවර්තන වියදම් ලෙස සටහන් කිරීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ව්‍යාජ ලෙස "පුම්බා පෙන්වා" මෙම ගරු සභාවට සාවද්‍ය තොරතුරු හා සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමෙන් සභාවේ විශ්වාසය සම්පූර්ණයෙන් අහිමි කරගෙන ඇති හෙයින්ද;

තවදුරටත් මුදල් අමාත්‍යවරයා විසින් එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනාව සම්මත කරයි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***